**ශීර්ෂය 198 - වාරිමාර්ග අමාත්‍යාංශය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය **198 -** වාරිමාර්ග අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය**,** එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වාරිමාර්ග අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 ජුනි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 සැප්තැම්බර් 25 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට වාරිමාර්ග අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම**,** විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්**,** වියදම්**,** වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) විගණනය වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පහත සඳහන් විගණන නිරීක්ෂණ අනුව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ අනුරූපී වී නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | මෙම වාර්තාවේ ඡේදයට යොමුව |
| --- | --- |
| මූල්‍ය නොවන වත්කම් ආරම්භක ශේෂ සටහන් කිරීමේදී වත්කම් ගිණුම් 4 ක එකතු වටිනාකම රු.1,321,253,268ක් ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂ හා නොගැළපීම හේතුවෙන් වත්කම් ගිණුම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි. | 1.6.1 (අ) දේපළ පිරියත හා උපකරණ |

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

### (අ) දේපළ පිරියත හා උපකරණ

දේපළ පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | මූල්‍ය නොවන වත්කම් ආරම්භක ශේෂය සටහන් කිරීමේදී කාර්යාල ගොඩනැගිලි ශේෂය රු.2,571,665 කින්, ප්‍රවාහන උපකරණ ශේෂය රු.48,500,000 කින්, යන්ත්‍රෝපකරණ හා උපකරණ ශේෂය රු.20,406,680 කින් හා ඉඩම් ශේෂය රු.1,249,774,923 කින්, ලෙස එකතු වටිනාකම රු. 1.321,253,268 ක් ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂයට වැඩියෙන් දක්වා තිබුණි. මෙහිදී ආරම්භක ශේෂයට සිදු කරන ලද ගැළපීම් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2021.12.31 දිනට අදාළ වත්කම් ගිණුම් ශේෂයන් හා 2022 ජංගම නොවන වත්කම් සංචලන වාර්තාවේ 2022.01.01 දිනට ශේෂයන් අතර වෙනසට හේතුව වාරිමාර්ග රාජ්‍ය අමාත්‍යාංශයේ හා මහවැලි රාජ්‍ය අමාත්‍යාංශයේ 2022 වර්ෂය තුළ වත්කම් ගිණුම් ශේෂ පැවරීමේදී, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් ආරම්භක ශේෂ ලෙස ගිණුම්ගත කිරීමයි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ඉකුත් වර්ෂ ශේෂයන් සමඟ සංසන්දනාත්මකව පරීක්ෂා කර නිවැරදි ශේෂයන් ඇතුළත් වන බවට තහවුරු කර ගත යුතුය. ආරම්භක ගිණුම් ශේෂ වලට සිදු කළ ගැළපීම් සම්බන්ධ විස්තර විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ii) | ඵලදායිතා ප්‍රවර්ධන හා වාරිමාර්ග පද්ධති කාර්යක්ෂමතා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 1,706.81 ක පිරිවැයක් දරා තිබුණු අතර එම පිරිවැයට අදාළ වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ඵලදායිතා ප්‍රවර්ධන හා වාරිමාර්ග පද්ධති කාර්යක්ෂමතා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය 2022.12.31 දිනට අවසන් කරන ලද ව්‍යාපෘතියකි. එම ව්‍යාපෘතියේ ආයතනික කටයුතු සඳහා මිලදී ගත් ලී බඩු හා යන්ත්‍ර උපකරණ විධිමත්ව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද ආයතන වලට භාරදී ඇති අතර ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් පරිහරණය කරන ලද ඉන්වෙන්ට්‍රි අයිතම අමාත්‍යාංශයේ ඉන්වෙන්ට්‍රි ලේඛනයේ සටහන් කර ඇත. | දේශීය හා විදේශීය අරමුදල් මත ක්‍රියාත්මක ව්‍යාපෘතීන්හි කටයුතු අවසානයේ පිරිවැයට අදාළ මූල්‍ය නොවන වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | භාණ්ඩාගාර ලේකම් විසින් වත්කම් ගිණුම්ගත කිරීම සම්බන්ධව නිකුත්කළ 2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය අනුව වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වුවත් වැය විෂය අංක 2506 - යටිතල පහසුකම් සංවර්ධනය යටතේ 2020 සහ 2021 වර්ෂයන් තුළ රු. 57,064,188,815 ක් වැයකර සංවර්ධනය කරන ලද දේපළ නිශ්චිත ලෙස හඳුනාගෙන මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම් ගත කර නොතිබුණි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් ස්ථාවර වත්කම් ගිණුම්ගත කිරීම සම්බන්ධව නිකුත් කරන ලද චක්‍රලේඛ වලින් 2101 සිට 2105 දක්වා වැය ශීර්ෂ වලින් ජනනය වන මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ අතර වැය විෂය 2506 - යටිතල පහසුකම් සංවර්ධනය යටතේ දරන ලද මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කිරීම සම්බන්ධව 2022 වර්ෂයේ සිට ගිණුම්කරණ ප්‍රතිපත්ති සකස් කර ගිණුම්ගත කිරීමට උපදෙස් ලබාදෙන ලදී. | ස්ථාවර වත්කම් ගිණුම්ගත කිරීම සම්බන්ධව භාණ්ඩාගාර ලේකම් විසින් 2017 ජුනි 28 දින නිකුත්කර ඇති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය මගින් ලබාදී ඇති උපදෙස් අනුව නව ජලාශ ඉදි කිරීම, ජලාශයන්හි වේලි ශක්තිමත් කිරීම, වාරිමාර්ග පද්ධති වැඩිදියුණු කිරීම, වාරිමාර්ග යටිතල පහසුකම් සංවර්ධනය, වාරි ඉඩම් සංවර්ධනය සහ වාහන හා අනෙකුත් වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කර කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත වාර්තා කිරීමට කටයුතු කළ යුතුය. |

(ආ) **විගණන සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 04 කට 2023 මැයි 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.166,008,413,765 ක් විය. | පිළිගනිමි.<br>විගණකාධිපති විසින් ඉදිරිපත් කරනු ලබන විගණන විමසුම් සඳහා ලබා දී ඇති නිශ්චිත කාලසීමාවන් තුළ පිළිතුරු සැපයීමට සෑමවිටම කටයුතු කර ඇති අතර අමාත්‍යාංශය යටතේ ඇති බස්නාගොඩ ජලාශ ව්‍යාපෘතිය, මොරගහකන්ද ව්‍යාපෘතිය සහ යාන් ඔය ව්‍යාපෘතිය සඳහා නිකුත් කරන ලද විගණන විමසුම් හතරකට අදාළව මේ වන විට ව්‍යාපෘති කළමනාකරණ ඒකක ස්ථාපිතව නොපවතින බැවින් පැහැදිලි කිරීම් ලබා දීමේදී ප්‍රමාදයක් සිදු වී ඇත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශය සඳහා රු.මිලියන 63,670 ක් ඇස්තමේන්තුව මගින් ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඒ යටතේ රු. මිලියන 45,594 ක් වැය කිරීම සඳහා අමාත්‍යාංශය විසින් සැලසුම්කර වරින් වර ප්‍රතිපාදන ඉල්ලුම් කර තිබුණද මහා භාණ්ඩාගාරය රු.මිලියන 10,127 ක් පමණක් නිදහස් කර තිබුණි. ඒ අනුව අයවැය මඟින් අනුමත කර තිබුණු ව්‍යාපෘති සැලසුම් කළ පරිදි ඉටු කිරීම සඳහා පුරෝකථනය කළ අග්‍රිම අවශ්‍යතාවයෙන් සියයට 16 ක් පමණක් නිදහස් කර තිබුණි. | පිළිගනිමි.<br>පැන නැගී ඇති අයහපත් ආර්ථික තත්වය මත භාණ්ඩාගාරයේ ද්‍රවශීලතාවය අනුව ඉල්ලා ඇති අක්මුදල් අවශ්‍යතාවයට සාපේක්ෂව අක්මුදල් නිදහස් කර ඇත.<br>අමාත්‍යාංශය සැම විටම භාණ්ඩාගාරය වෙත ඉල්ලීම් ඉදිරිපත් කරමින් අවශ්‍ය අග්‍රිම ප්‍රමාණ ලබා ගැනීමට උපරිම ලෙස කටයුතු කර ඇත. | අග්‍රිම සැලසුම් කිරීමේදී ප්‍රායෝගික තත්වයන් සලකා බලා විචලතා අවම වන පරිදි පුරෝකථනය සිදු කළ යුතුය. |

### 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2017 අප්‍රේල් 27 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 255/2017 හි 02(ඇ) ඡේදය ප්‍රකාරව මුදල් වර්ෂයට අදාළ ගෙවීම් එම මුදල් වර්ෂයේ දී නිදහස් කළ යුතු අතර, කිසිදු බැරකමක් ඊළඟ වර්ෂය තුළ නිරවුල් කිරීමේ අරමුණ ඇතිව ඉදිරියට ගෙන නොයා යුතු බවට වූ උපදෙස් පිළිබඳ නොසලකා 2022 දෙසැම්බර් 31 දිනට වැය විෂයයන් 13 කට අදාළව රු.1,915,869,976 ක් වූ බැරකම් වලට එළඹ තිබුණි. | මධ්‍යකාලීන අයවැය රාමුව තුළ වෙන්කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය ඉක්මවා නොයන පරිදි මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතිවල අත්‍යවශ්‍යයෙන්ම කළයුතු කාර්යයන් සඳහා 2022 වර්ෂය තුළ බැඳීම් ඇති කර ගෙන ඇත. නිරවුල් කිරීමට ප්‍රමාණවත් අක්මුදල් නොලැබීම හේතුවෙන් 2022.12.31 දිනට වැය ශීර්ෂ 13කට අදාළව රු.1,915,869,976 ක බැරකම් මූල්‍ය ප්‍රකාශන මඟින් නිරූපණය කරයි. එම සියලුම බැරකම් සඳහා මේ වන විට නිරවුල් කර ඇත. | චක්‍රලේඛ විධිවිධාන අභිබවා බැරකම් වලට එළඹීම නොකළ යුතු අතර අත්‍යවශ්‍ය වන්නේ නම් භාණ්ඩාගාර අනුමැතිය ලබා ගත යුතු වේ. ඒ සඳහා වූ සාධාරණීකරණයන් විධිමත්ව ගොනු කිරීමට හා අනු අංක සහිත ලේඛනයක් නඩත්තු කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2017 අප්‍රේල් 27 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 255/2017 ප්‍රකාරව, කටයුතු කර නොතිබීම හේතුවෙන් අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන වල බැඳීම් හා බැරකම් ප්‍රකාශයේ ඇමුණුම (iii) හි 2022 දෙසැම්බර් 31 දිනට බැරකම් ශේෂය රු. 1,915,869,976 ක් වුවද රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ පොත් අනුව එදිනට ශේෂය රු.1,885,490,468 ක් විය. ඒ අනුව රු.30,379,508ක වෙනසක් විය. | 2022 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන වල බැඳීම් හා බැරකම් ප්‍රකාශයේ ශේෂය සහ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ පොත් අනුව ශේෂයන්හි වෙනස රු.30,379,507ක් අමාත්‍යාංශයේ බැරකම් ලේඛනයේ පවතින නමුත් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ පොත් වලට ඇතුළත් වී නොමැත. ගිණුම් පිළියෙල කිරීමේදී රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත මෙම දත්ත යොමු කළද මෙම ගැළපීම් දත්ත පද්ධතියට ඇතුළත් කිරීමට පෙර අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් වීම මත මෙම වෙනස පැන නැඟී ඇත. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 255/2017 ප්‍රකාරව නිශ්චිත දිනයන්ට බැරකම් ඇතුළත් කර සිගාස් පද්ධතිය හා දෙපාර්තමේන්තු බැරකම් ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | මොරගහකන්ද ජලාශයේ ප්‍රධාන බැම්ම ඉදිකිරීම ව්‍යාපෘතියේ විදුලි උත්පාදන යන්ත්‍ර හතරක් සවිකිරීමේදී ඇමෙරිකානු ඩොලර් 10,937,960ක විචලතා ගෙවීම සම්බන්ධයෙන් වූ 2016 නොවැම්බර් 29 දිනැති අංක අමප16/2513/704/067 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ව්‍යාපෘතිය අවසන් කිරීමෙන් පසුව ප්‍රධාන බැම්ම හා එහි විදුලිබල පද්ධතිය වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ පාලනය කර, ශ්‍රී ලංකා රජය වෙනුවෙන් විදුලි බලය නිපදවිය යුතු අතර, නිෂ්පාදිත විදුලිය ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලයට අලෙවිකර ලබා ගන්නා මුදලින් ව්‍යාපෘතිය සඳහා ලබාගත් ණය මුදල ආපසු ගෙවිය යුතුවේ. එසේ වුවද නිෂ්පාදිත විදුලිය අලෙවි කිරීම සඳහා ගිවිසුමකට එළඹීමට හෝ අදාළ ණය මුදල ගෙවීමේ වගකීම ගිණුම් ආකෘතිය (iii) බැඳීම් හා බැරකම් ප්‍රකාශනයේ හෙළිදරව් කර නොතිබුණි. | පිළිගනිමි.<br>ඉදිරි වර්ෂ සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී විගණන විමසුමේ පෙන්වා දී ඇති පරිදි කටයුතු කරමි. | අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ණය මුදල ආපසු ගෙවීමේ වගකීම බැඳීමක් ලෙස හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතු අතර නිෂ්පාදිත විදුලිය අලෙවි කිරීම සඳහා ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය සමඟ ගිවිසුමකට එළඹිය යුතුය. |

## 2.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියලුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 1.6.1(ආ) ඡේදය ප්‍රකාරව විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී නොතිබුණි. | විගණකාධිපති විසින් ඉදිරිපත් කරනු ලබන විගණන විමසුම් සඳහා ලබා දී ඇති කාලසීමාවන් තුළ පිළිතුරු සැපයීමට කටයුතු කර ඇතත් අමාත්‍යාංශය යටතේ ඇති සංකීර්ණ බහුකාර්ය ව්‍යාපෘති වලට අදාළ තාක්ෂණික වශයෙන් ගැඹුරු කරුණු සම්බන්ධයෙන් වූ නිරීක්ෂණ සඳහා පිළිතුරු සැපයීමේදී උපකාර්යාල හා සම්බන්ධ වෙමින් තොරතුරු ඉදිරිපත් කිරීමේදී කාල පමාවක් ඇති වී ඇති බව පිළිගනිමි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | | |
| | රු. | | | |
| 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන අයවැය චක්‍රලේඛයේ 1.1.7 ඡේදය | 434,066 | වර්ෂ 5 කට වැඩි කාලයක් තිස්සේ පවතින හඳුනානොගත් ණයගැති ශේෂය 2023 මැයි වන විටත් හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2004 වර්ෂයේ දී අමාත්‍යාංශ මාරුවීම ම හඳුනා නොගත් ණය ශේෂ ලෙස මෙම වටිනාකම් වාර්තා වන අතර මෙම ණය නිරවුල් කර ගැනීම සඳහා වර්ෂ ගණනාවක සිට ම උත්සහ දරා ඇතත් නිවැරදි තොරතුරක් මෙතෙක් අනාවරණය කරගැනීමට නොහැකි වී | ණය ශේෂ හඳුනාගෙන චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | | ඇත. හය දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් මඟින් තොරතුරු අනාවරණය කරගෙන මෙම ණය ශේෂය නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. |

## 2.5 බැංකු ගිණුම් මෙහෙයවීම

බැංකු ගිණුම් මෙහෙයවීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ අඩුපාඩු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්ෂය අවසාන දිනට මුදල් පොතේ පැවති ශේෂය මහා භාණ්ඩාගාරය වෙතට ප්‍රේෂණය කළ යුතු වුවද 2022 දෙසැම්බර් 31 දිනට දේශීය අරමුදල් යොදවා ක්‍රියාත්මක කළ කිවුල් ඔය ජලාශ ව්‍යාපෘතියට අදාළව මුදල් පොතේ පැවති රු.855,849ක් මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර නොතිබුණි. | කිවුල් ඔය ජලාශ ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය මුදල් මුදාහරිනු ලබන්නේ මහවැලි අධිකාරිය විසින් නඩත්තු කරන ගිණුමක් මගිනි. අමාත්‍යාංශය විසින් නිකුත් කළ අක්මුදල් මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කරනු ලබන්නේද මෙම ගිණුම හරහාය. අමාත්‍යාංශය ව්‍යාපෘතිය වෙත නිකුත් කළ අක්මුදලින් 2022 දෙසැම්බර් 31 දිනට ඉතිරි භාණ්ඩාගාරය වෙත නිවැරදිව ප්‍රේෂණය කර ඇත. ගිණුමේ එදිනට පෙන්වන ඉතිරි ශේෂය මහවැලි අධිකාරිය සතු වේ. | අමාත්‍යාංශය විසින් ව්‍යස්ථාපිත ආයතන හෝ ව්‍යාපෘති කාර්යාල සඳහා නිදහස් කරනු ලැබූ අරමුදල් වන බැවින් වර්ෂ අවසාන ඉතිරිය භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශය යටතේ වූ ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ වාරි සෞභාග්‍යා වැඩසටහන මඟින් ග්‍රාමීය වැව්, අමුණු සහ ඇළ මාර්ග 5,000ක් පුනරුත්ථාපනය, අලුත්වැඩියා කිරීම සහ නවීකරණය කිරීමට සැලසුම් කර තිබුණි. එහිදී දිවයිනේ දිස්ත්‍රික්ක 25 ආවරණය වන පරිදි මහවැලි කලාප ආශ්‍රිත කුඩාවැව් හැර අනෙකුත් සියලු ග්‍රාමීය වැව්/ අමුණු 1,340 ක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ආයතන 13 කට 2021 වර්ෂයේදී රු. මිලියන 4,210.29ක්ද, 2022 වර්ෂයේදී රු. මිලියන 2,493 ක්ද වශයෙන් එකතුව රු. මිලියන 6,703.29 ක ප්‍රතිපාදන බෙදා දී තිබුණි. එයින් 2022 වර්ෂය වන විට වැව්/ අමුණු 1,034 ක පමණක් භෞතික ප්‍රගතිය සම්පූර්ණ කර තිබුණු අතර, ඉදිකිරීම් ප්‍රගතිය සියයට 03 සිට සියයට 75 අතර වූ වැව්/ අමුණු 133 ක් වැඩ නිම වූ කොන්ත්‍රාත් ලෙස සලකා ප්‍රගති වාර්තා වල ඇතුළත් කර තිබුණි. | 2022 වසර තුළ අවසන් කළ හැකි ක්‍රියාකාරකම් පමණක් නිම කර, ව්‍යාපෘති කටයුතු අවසන් කර ඇත. ඒ අනුව එම ව්‍යාපෘති 100% භෞතිකව වැඩ නිමකර නොමැති අතර, භෞතිකව වැඩ අවසන් කළ ව්‍යාපෘති ලෙස සලකා ඇත. ග්‍රාමීය වැව් සංවර්ධනය හා අදාළ ප්‍රගති වාර්තා දිස්ත්‍රික් මට්ටමින් හා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වත්කම් කළමනාකරණ අංශය මඟින් ලබා දුන් තොරතුරු පදනම් කරගනිමින් වාරිමාර්ග අමාත්‍යාංශයේ සැලසුම් අංශය විසින් සකස් කර ඉදිරිපත් කර ඇති අතර එම ව්‍යාපෘති අවලංගු කිරීම සිදුකර ඇත්තේ ඒ ඒ අවස්ථාවල අමාත්‍යාංශ මට්ටමින් හා ජාතික මට්ටමින් ගනු ලැබූ තීරණ පදනම් කර ගනිමිනි. | සියයට 03 සිට සියයට 75 දක්වා වූ අඩු ප්‍රගතියක් සහිත ව්‍යාපෘති සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති වාර්තාවෙන් ඉවත් කළ යුතුයි. මෙම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කළ නිලධාරීන් සම්බන්ධව විනය ක්‍රියාමාර්ගයකට යා යුතුය. |
| (ආ) | **බස්නාගොඩ ජලාශ ව්‍යාපෘතිය**<br>ගම්පහ, අත්තනගල්ල හා මිනුවන්ගොඩ ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සභාපතිවරයා සහ China Machinery Engineering Corporation සමාගමේ සභාපතිවරයා අතර 2013 මැයි 15 වන දින එළඹ තිබූ කොන්ත්‍රාත් ගිවිසුම අනුව ඇ.ඩො. මිලියන 229.5 ක වටිනාකමකින් යුත් උක්ත ව්‍යාපෘතිය 2014–2017 කාලපරිච්ඡේදයේ ක්‍රියාත්මක කර අවසන් කිරීමට නියමිතව තිබුණි. එම ව්‍යාපෘතියේ මූලික ජල මූලාශ්‍රය වූ බස්නාගොඩ ජලාශය ඉදිකිරීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව සමඟ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, 2016 මාර්තු 22 හා 2019 ජූනි 12 යන දිනයන් | | |

හිදී අවබෝධතා ගිවිසුම් දෙකකට එළඹ තිබුණි. මෙම ව්‍යාපෘතියට අදාළ තාක්ෂණික ඇගයීම් කමිටුව (TEC) විසින් ලබාදුන් නිර්දේශ අනුව අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ ප්‍රසම්පාදන කමිටුව (CAPC) විසින් බස්නාගොඩ ජලාශයේ ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව රු.2,347,406,831 කට චීනයේ සිනෝහයිඩ්‍රෝ සමාගම (Sinohydro Corporation Limited) වෙත ප්‍රදානය කිරීම සඳහා නිර්දේශ ලබා දී තිබුණි. ඒ සඳහා ලද අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත ජලාශය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම් විසින් උක්ත සමාගම සමඟ 2019 ජූනි 13 වන දින රු.2,394,354,968 ක (රු.46,948,137ක ජාතිය ගොඩනැගීමේ බදු ඇතුළත්ව) වටිනාකමකින් යුත් ඉංජිනේරු, ප්‍රසම්පාදන හා ඉදිකිරීම් (EPC) කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබුණි. ව්‍යාපෘතියට අදාළව පහත නිරීක්ෂණ ඉදිරිපත් කෙරේ.

| | | | |
|---|---|---|---|
| (i) | මෙහිදී නිලධාරීන් හයදෙනෙකුගෙන් සමන්විත තාක්ෂණික ඇගයීම් කමිටුව (TEC) කොන්ත්‍රාත්තුව සඳහා අවම මිල ඉදිරිපත් කර තිබුණු කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කළ රු.මිලියන 2,093 ක ලංසුව රු. මිලියන 2,347ක් ලෙස නිවැරදි විය යුතු බවට ගණනය කර තිබුණි. එහිදී ඉංජිනේරු ඇස්තමේන්තුවේ අයිතම අංක 05 යටතේ මූලික වැඩ සඳහා (Preliminaries) කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කර තිබූ රු.මිලියන 99.689ක වියදමට රු.254,062,080 ක අමතර වටිනාකමක් එකතු කිරීමට තාක්ෂණික ඇගයීම් කමිටුව (TEC) කටයුතු කර තිබුණි. එසේ වුවද කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කළ මිල ගණන් තුළ අයිතම අංක 4 යටතේ ස්ථාපනය කිරීම, ඉදිකිරීම සහ වෙනත් සේවාවන් (Installation/ Construction and other Services) ලෙස රු.254,062,080 ක් දක්වා තිබූ අතර ඒ පිළිබඳ නොසලකා තාක්ෂණික ඇගයීම් කමිටුව (TEC) අයිතම අංක 5 සඳහාද සාවද්‍ය ලෙස රු.254,062,080ක් එකතු කර ඉදිරිපත් කළ ලංසුවට වඩා රු. 254,062,080ක් වැඩියෙන් කොන්ත්‍රාත්තුව පැවරීමට නිර්දේශ කර තිබුණි. තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් සිදුකර තිබුණු උක්ත සංශෝධනය ඉංජිනේරු ප්‍රසම්පාදන හා | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ වගන්ති 7.9.2 ප්‍රකාරව විස්තරාත්මක ලංසු ඇගයීමට පෙර ලැබී ඇති ලංසු අංක ගණිතමය වශයෙන් නිවැරදි දැයි පරීක්ෂා කළ යුතු අතර එහිදී සිදුවූ ප්‍රමාද දෝෂයකින් කොන්ත්‍රාත්කරු විසින් රු. මිලියන 2,093 කට ඉදිරිපත් කර තිබූ ලංසුව රු.මිලියන 2,347 ලෙස සංශෝධනය වී ඇත. | වගකීම් විරහිතව ක්‍රියා කර ඇති තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයින් සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණ පැවැත්වීමට අදාළ පත්වීම් බලධාරීන් වෙත යොමු කළ යුතුය.<br>මීට අමතරව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ නොසලකා කටයුතු කිරීම තුළ රජයට සිදු කර ඇති පාඩුව සම්බන්ධයෙන් 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව නීතිය බලාත්මක කිරීමේ නියෝජිත ආයතන වෙත පැමිණිලි කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ඉදිකිරීම් කොන්ත්‍රාත් ප්‍රසම්පාදන ලේඛනයේ මූලික නිර්ණායකයන්ට පටහැනි වූ අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6.1(අ)(v) වගන්තිය අනුව ලංසුකරුගෙන් ලිඛිතව පැහැදිලි කිරීම් ලබා නොගෙන රු. 254,062,080 කින් කොන්ත්‍රාත් වටිනාකම වැඩි කිරීමට තාක්ෂණික ඇගයීම් කමිටුව නිර්දේශ කර තිබුණි. එහිදී ප්‍රසම්පාදන අස්ථිත්වය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.3 යටතේ පැවරී ඇති වගකීම් නිසිලෙස ඉටු කරද නොතිබුණි. | | |
| (ii) | උක්ත රු.254,062,080 කින් වැඩිකරන ලද වටිනාකමට කොන්ත්‍රාත්තුව පිරිනැමීම හා ඒ මත පදනම්ව අත්තිකාරම් ගණනය කර ගෙවීම හේතුවෙන් කොන්ත්‍රාත්කරු වෙත 2019 වර්ෂයේදී වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස (Mobilization advance) රු. 50,812,416 ක් වැඩිපුර ගෙවා තිබුණි. | ලංසු වල මිල ගණන් නිවැරදි කිරීමේදී තාක්ෂණික ඇගයීම් කමිටුවට සිදුවූ අතපසු වීමකින් කොන්ත්‍රාත් මිල සාවද්‍ය ලෙස රුපියල් මිලියන 2347ක් ලෙස ගණනය වීම හේතුවෙන් අමතරව එකතු කළ රු. 254,062,079 සඳහා 20%ක සංචලන අත්තිකාරම් ලෙස රුපියල් මිලියන 50,812,416ක මුදලක් කොන්ත්‍රාත්කරුට අමතරව ගෙවීමට සිදු ව ඇත. | වැඩිපුර ගෙවා ඇති රු.50,812,416ක අත්තිකාරම් මුදල සඳහා 2019 වර්ෂයේ සිට ආපසු අයකර ගනු ලබන දින දක්වා වූ කාල සීමාවට අදාළව පොලිය ගණනය කර එම පොළිය කොන්ත්‍රාත්කරුගෙන් හෝ වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුයි. |
| (iii) | වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම්වරයා විසින් කොන්ත්‍රාත්කරු සමඟ 2019 ජුනි 13 වන දින එළඹ තිබුණු කොන්ත්‍රාත් ගිවිසුමෙහි iv වන කොටසෙහි ඇතුළත් විශේෂිත කොන්දේසි (Particular Conditions of Contract) 14.4 උප වගන්තිය යටතේ වූ අතුරු ගෙවීම් සහතික කිරීමට අදාළව නිමකළ යුතු භෞතික ප්‍රගතිය ළඟා කරගෙන නොතිබිය දී වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම් දැනුවත් කිරීමකින් තොරව හා අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ ප්‍රසම්පාදන කමිටුව (CAPC) විසින් අනුමත කරතිබූ කොත්ත්‍රාත් ගිවිසුම අනුමැතියකින් තොරව වෙනස් කර ගෙවීම් සහතික කිරීමට භාවිතා කොට තිබුණි. ඒ අනුව 2020 සිට 2022 දක්වා අතුරු ගෙවීම් (Interim Payments) 11ක් මගින් රු.401,165,861ක් විධිමත් අධිකාරී බලයකින් තොරව හා කොන්ත්‍රාත් ගිවිසුමේ අදාළ වගන්තිය පිළිබඳ නොසලකා ගෙවීම් කර තිබුණි. | ගිවිසුමේ 14.4 වගන්තිය ප්‍රකාරව කොන්ත්‍රාත්කරුට ගෙවීම් කිරීම, ගිවිසුමේ ඇතුළත්කර ඇති ගෙවීම් කාලසටහන අනුව කොන්ත්‍රාත් කාර්යයන් පිළිබඳව කොන්ත්‍රාත්කරු ළඟා කරගන්නා සත්‍ය ප්‍රගතිය හා වැඩ සැලැස්ම (Work Breakdown Structure) අනුව කළයුතු බව දන්වා ඇත. එනමුදු, මෙම කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කිරීමේදී ඉඩම් අත්පත් කරගැනීමේ ප්‍රමාදයන් හා බලපෑ විවිධ ගැටලු හේතුවෙන් කොන්ත්‍රාත්තුවේ කාර්යයන් වල ප්‍රගතිය ඉතා මන්දගාමී වූ අතර අත්පත් කරගන්නා ලද ප්‍රගතිය අතුරු ගෙවීම් කාලසටහනෙහි සඳහන් ප්‍රගතියට වඩා අඩුවිය.<br>එබැවින් ගෙවීම් කාලසටහන අනුව කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු අතුරු ගෙවීම් කිරීම | කොන්ත්‍රාත් ගිවිසුමෙහි විශේෂිත කොන්දේසි පිළිබඳ නොසලකා හැර, අමාත්‍යාංශ ලේකම්ගේ හා අමාත්‍ය මණ්ඩල අනුමැතියෙන් තොරව කොන්ත්‍රාත්කරුට වාසිදායක ලෙස ගෙවීම් කළ නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | | ප්‍රායෝගිකව කළ නොහැකි වූ අතර කොන්ත්‍රාත්තුවේ ප්‍රගතිය අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා කොන්ත්‍රාත්තුව ප්‍රකාරව කොන්ත්‍රාත්කරුට ගෙවීම් කිරීමට සිදු විය. එහිදී සේවා යෝජකයා විසින් ගිවිසුමේ සාමාන්‍ය කොන්දේසි 14.4(b) හා උප වගන්ති 3.5 ප්‍රකාරව අන්තර් වාර ගෙවීම් කිරීම සඳහා කටයුතු කර ඇත.<br>කොන්ත්‍රාත් ගිවිසුමේ විශේෂ කොන්දේසි 14.2 ලංසු ලේඛන වලද සඳහන්ව තිබූ හෙයින් හා ලංසු ලේඛන අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලැබූ හෙයින්ද එම ලංසු ලේඛන පරිදි ලංසු ඇගයීමෙන් පසුව කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ඇති හෙයින්ද කොන්ත්‍රාත් ගිවිසුමෙහි විශේෂිත කොන්දේසි සඳහා අමතර අමාත්‍ය මණ්ඩල අනුමැතියක් අවශ්‍ය නොවේ.<br>ඒ අනුව කරන ලද අතුරු ගෙවීම් කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි වලට පටහැනි නොවන බව දන්වා සිටිමි. | |
| (iv) | ඉංජිනේරු, ප්‍රසම්පාදන හා ඉදිකිරීම් (EPC) කොන්ත්‍රාත් වලට අදාළ First Edition 1999 (ISBN**2** – 8843-0220-9) පොදු මාර්ගෝපදේශයේ 14.2 උප වගන්තිය ප්‍රකාරව අත්තිකාරම් ගෙවීම් නැවත අයකර ගැනීම මුළු කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 30 සම්පූර්ණ කිරීමෙන් පසුව සිදුකරනු ලබන බවට වූ විශේෂ කොන්දේසියට සමගාමීව 14.4 උප වගන්තියෙහි වූ ගෙවීම් ලේඛනයට (Schedule of Payment) අදාළ විශේෂ කොන්දේසි ඇතුළත් කර තිබුණද ඒ පිළිබඳ නොසලකා ගෙවීම් කිරීම හේතුවෙන් 2022 ඔක්තෝබර් 31 දිනට ව්‍යාපෘතියේ අදාළ ගෙවීම් සහතික කරන දින වන විට භෞතික කාර්යසාධනය සියයට 17.09ක් ව පැවතියදී, 2020-2022 කාලපරිච්ඡේදය තුළ අතුරු ගෙවීම් 11ක් මගින් රු. 401,165,861ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. | ගිවිසුමෙහි 14.2 විශේෂ කොන්දේසි ප්‍රකාරව අත්තිකාරම් ආපසු අයකරගැනීම කොන්ත්‍රාත්තුවේ වැඩවල ප්‍රගතිය සියයට 30 දක්වා ළගාවීමෙන් පසුව කරන බව දක්වා ඇත.<br>එසේම 14.4 විශේෂ කොන්දේසි අනුව කොන්ත්‍රාත්කරුට ගෙවීම සිදුකිරීම කොන්ත්‍රාත්තුවේ සත්‍ය ප්‍රගතිය, ගෙවීම් කාලසටහන හා වැඩ සැලැස්ම සහ කොන්ත්‍රාත්තුවේ සාමාන්‍ය කොන්දේසි මත සිදුකරන බව දක්වා ඇත. එබැවින් සේවා යෝජකයා විසින් කොන්ත්‍රාත් ගිවිසුමෙහි වගන්ති 3.5 ප්‍රකාරව කටයුතු කර ඇත. භෞතික කාර්යසාධනය සියයට 17.09 ක්ව පැවතියදී එයින් සියයට 16 | කොන්ත්‍රාත් ගිවිසුමෙහි විශේෂිත කොන්දේසි පිළිබඳ නොසලකා හැර, අමාත්‍යාංශ ලේකම්ගේ අධිකාරී බලයෙන් තොරව කොන්ත්‍රාත්කරුට වාසිදායක ලෙස ගෙවීම් කළ නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | | ක් සඳහා ගෙවීම් කර ඇති අතර ඉතිරි සියයට 20 සංචලන අත්තිකාරම වේ. මෙම සංචලන අත්තිකාරම් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිළිගත් බැංකුවකින් මුළු අත්තිකාරමට සමාන වලංගු වගකීම් සහතිකයක් ඉදිරිපත් කර ඇත. | |
| (v) | ව්‍යාපෘතියේ ප්‍රධාන කොන්ත්‍රාත්කරු වන Chaina Machinery Engineering Corporation විසින් ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අතිරේක සමානාධිකාරිවරයා අමතන ලද අංක CMEC/ATTANA/20120730/007 හා 2012 ජූලි 30 දිනැති ලිපිය මඟින් ප්‍රධාන කොන්ත්‍රාත්තුවට අතිරේකව සිදුකරනු ලබන කාර්යන්හි (Indirect Works) සමස්ත වගකීම සෘජුවම ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත පැවරෙන බවත් උප කොන්ත්‍රාත්කරුවන්ගේ කාර්යන් ඉටුකිරීමේ ප්‍රමාදයන් නිසා දැරීමට සිදුවන අමතර පිරිවැය හේතුවෙන් ප්‍රධාන කොන්ත්‍රාත්කරුගේ කාර්යන්ට සිදුවන අහිතකර බලපෑම සම්බන්ධයෙන් වන කිසිදු වගකීමක් එම සමාගම වෙත නොපැවරෙන බවත්, එකී ප්‍රමාදයන් සඳහා කාලය දීර්ඝ කිරීම් ලබා ගැනීමට හා ඒ සඳහා වන අතිරේක පිරිවැය ලබාගැනීමට තම සමාගමට අයිතියක් පවතින බවත් දැනුම් දී තිබුණි. ව්‍යාපෘතිය 2017 වසරේ නිම කළ යුතු වුවද එම කාල සීමාව තුළ ජල මූලාශ්‍රයේ ඉදිකිරීම් කටයුතු නිමකිරීම ප්‍රායෝගිකව කළ නොහැකිව තිබියදී ඒ පිළිබඳ සැලකිලිමත් වීමෙන් තොරව 2016 මාර්තු 12 දින වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සභාපති සමඟ පළමු අවබෝධතා ගිවිසුමට (MOU) එළඹ තිබුණි. එහිදී දෙපාර්තමේන්තුව විසින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් තොරව අදාළ උප කොන්ත්‍රාත්තුව භාර ගෙන තිබූ අතර 2019 ජූනි මස 12 දින දෙවන අවබෝධතා ගිවිසුමට එළඹෙන අවස්ථාව වන විටත් ප්‍රධාන කොන්ත්‍රාත් ගිවිසුමේ කාලය අවසන් වී තිබුණි. කොන්ත්‍රාත්තුව මේ දක්වා නිම කර නොතිබීම මේ හේතුවෙන් ප්‍රධාන කොන්ත්‍රාත්කරුට කාලය | China Machinery Engineering Corporation සමග ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ගම්පහ අත්තනගල්ල මිනුවන්ගොඩ ඒකාබද්ධ ජලසම්පාදන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අත්සන් කරන ලද ගිවිසුමේ වක්‍රවැඩ (Indirect Work) සඳහා වෙන්කර ඇති මුදල් වලින් බස්නාගොඩ ජලාශය ඉදිකිරීම සඳහා ජලසම්පාදන අමාත්‍යාංශය විසින් ඒ සඳහා විශේෂඥ දැනුම ඇති ආයතන සතුව පවතින වාරිමාර්ග අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අදාළ කොන්ත්‍රාත්තුව චීනයේ සිනෝහයිඩ්‍රෝ ආයතනය වෙත ලබා දී ඇත. මෙම කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කිරීමේ හා ඉදිකිරීම් කටයුතු අධීක්ෂණය සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවට පවරා ඇත. එබැවින් අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම මගින් වාරිමාර්ග දෙපාර්තමේන්තුව බස්නාගොඩ ජලාශය ඉදිකිරීම සඳහා උප කොන්ත්‍රාත් ලබාගැනීමට කටයුතු කර නොමැත. කරුණු එසේ හෙයින් ප්‍රසම්පාදන කටයුතු සඳහා අතිරේක කාලයක්, අමතර පරිපාලන පිරිවැයක් හා අවිධිමත්භාවයක් මෙහිදී සිදුව ඇති බව නොපෙනේ. | මෙම කොන්ත්‍රාත්තුව භාර ගැනීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය, ගෙවීම් සහතික කිරීම, කොන්ත්‍රාත් පරිපාලනය, යන කාර්යයන් තුළ අතිරේක කාලයක්, අමතර පරිපාලන පිරිවැයක් හා අවිධිමත්භාවයක් සිදු වී තිබේද යන්න පරීක්ෂණ මණ්ඩලයක් පත් කර තහවුරු කර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දීර්ඝ කර ගැනීමට සහ අතිරේක පිරිවැය සඳහා හිමිකමක් පැවතීම හා එහි වගකීම උප කොන්ත්‍රාත්කරු ලෙස වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත විතැන් කිරීමේ හැකියාවක් පැවතුණද ඒ සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | | |
| (ඇ) | **මහා/මධ්‍යම පරිමාණ ව්‍යාපෘති පිළිබඳ දස අවුරුදු සැලැස්ම.** | | |
| (i) | මෙම දස අවුරුදු සංවර්ධන සැලැස්ම අනුව මහගල්ගමුව වැව ප්‍රගුණවත් කිරීම, පහළ මල්වතු ඔය ජලාශය ඉදිකිරීම, රිදීමාලියද්ද ඒකාබද්ධ සංවර්ධනය, කිවුල් ඔය ජලාශය, කවුඩුල්ල වම් ඉවුර ප්‍රධාන ඇළ දම්සෝපුර වැව දක්වා දීර්ඝ කිරීම, රඹකැන් ඔය ඒකාබද්ධ සංවර්ධනය සහ මහවැලි බී කලාපය මාදුරු ඔය දකුණු ඉවුර සංවර්ධනය යන ව්‍යාපෘති 7 ක ශක්‍යතා අධ්‍යනයන් නිමකිරීමෙන් අනතුරුව 2012-2017 කාලසීමාව තුළ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සැලසීමට 2011 සැප්තැම්බර් 28 දිනැති අංක 11/1851/508/034 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලැබී තිබුණි. එම ව්‍යාපෘති 7 ට අදාළව රු. මිලියන 76,043 ක් වූ මුළු පිරිවැය ඇස්තමේන්තු යටතේ 2022 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 6,528 ක් වැය කර තිබුණු නමුත් එකී ව්‍යාපෘති අතරින් එක් ව්‍යාපෘතියක්වත් සමාලෝචිත වර්ෂය දක්වා සම්පූර්ණයෙන් නිම කර නොතිබූ අතර ව්‍යාපෘති 3 කට අදාළව නිම කිරීමේ ප්‍රතිශතය වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක වලින් සියයට 1 ත් 5 ත් අතර විය. එකී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මගින් නව කුඹුරු හෙක්ටයාර් 68,000 කට පමණ වාරි ජලය සැපයීම, දැනට වගාකරනු ලබන ඉඩම් හෙක්ටයාර් 203,000 ක් සඳහා යල මහ දෙකන්නයේම ජලය සැපයීම සහ මෙ.වොට්. 200 ක විදුලි බලය නිෂ්පාදන අරමුණු කර තිබුණද එම ප්‍රතිඵල ජාතික ආර්ථිකයට එක් වී නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත. | දස අවුරුදු සැලැස්ම තුළ ඇතුළත් එක් එක් ව්‍යාපෘතිය ප්‍රමාද වීමට බලපෑ හේතු හා එකී ප්‍රමාදය තුළින් ජාතික ආර්ථිකයට අහිමි වූ දායකත්වය පිළිබඳ ඇගයීමක් සිදු කොට අමාත්‍ය මණ්ඩලය වෙත වාර්තා කළ යුතුය. පහළ මල්වතු ඔය ව්‍යාපෘතිය හැර ඉතිරි ව්‍යාපෘති අත්හැර දමා ඇති බැවින් එම ව්‍යාපෘති ඉදිරියට ක්‍රියාත්මක කිරීමේ හැකියාව සලකා බලා මෙවැනි ප්‍රමාදයන් වැළකෙන පරිදි ව්‍යාපෘති සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුය. |
| (ii) | උක්ත අමාත්‍ය මණ්ඩල තීරණය අනුව වාරිමාර්ග ක්ෂේත්‍රයේ අනාගත සංවර්ධන කටයුතු ඉහත සංවර්ධන සැලැස්මට අනුකූලව සකස්කළ යුතු බවට තීරණය කර තිබුණු නමුත් එම සැලැස්ම තුළ ඇතුළත් නොවූ 2023 නිමකළ යුතු කුඩාවිලච්චිය | පිළිතුරු ලබා දී නැත. | අමාත්‍යාංශයේ විෂය පථයට අදාළව අමාත්‍ය මණ්ඩල විසින් ගනු ලබන සියලු ප්‍රතිපත්තිමය තීරණ සංයුක්ත සැලැස්ම හා |

| | | | |
|---|---|---|---|
| | ජලාශ ප්‍රතිසංස්කරණය, 2021 දී නිමකළ යුතු එලදායිතා ප්‍රවර්ධන හා වාරිමාර්ග පද්ධති කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම (PEISEIP), 2018 දී නිමකළ යුතු තල්පිටිගල ජලාශය, 2017 දී නිම කළ යුතු ගිං නිල්වලා හැරවුම, 2022 දී නිම කළ යුතු දෙමටගල්ල වැව ප්‍රතිසංස්කරණය, 2024 නිම කළ යුතු හිඹිලියාකඩ වත්තේගෙදර වාරිමාර්ග යටිතල පහසුකම් සංවර්ධනය කිරීම යන ව්‍යාපෘති 6 රු. මිලියන 74,423.4ක ඇස්තමේන්තු වටිනාකමක් යටතේ 2014 වර්ෂයෙන් පසු ආරම්භකර 2022 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 6,902.44ක් වැයකර තිබුණි. එකී ව්‍යාපෘති අතරින් එක් ව්‍යාපෘතියක්වත් මේ දක්වා සම්පූර්ණයෙන් නිම කර නොතිබුණු අතර ව්‍යාපෘති 5කට අදාළව නිම කිරීමේ ප්‍රතිශතය 0.06 ත් 13.16 ත් අතර විය. | | ක්‍රියාකාරී සැලසුම් තුළ ඇතුළත් කර ප්‍රගති සමාලෝචනයන් සිදු කරමින් ඉලක්ක ගත දිනවලට නිම කිරීමට කළ යුතුය. |
| (ඈ) | **අනුරාධපුර දිස්ත්‍රික්කයේ, වැලිඔය මහවැලි L කලාපය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය - කිවුල් ඔය ජලාශය ඉදිකිරීම ව්‍යාපෘතිය**<br><br>මෙම ව්‍යාපෘතිය යටතේ මීටර් කියුබ් මිලියන (MCM) **66ක** ධාරිතාවකින් යුත් ජලාශයක් ඉදිකිරීමට යෝජිත වූ අතර එමගින් වැලි ඔය ප්‍රදේශයේ පවත්නා ඉඩම් හෙක්ටයාර 700ක් සඳහා සහ මා ඔය හා වැලි ඔය අතර ප්‍රදේශයේ නව ඉඩම් හෙක්ටයාර 1,700ක් සඳහා වාරි ජල පහසුකම් සැපයීමද, පානීය ජලය සැපයීමද අරමුණු කරගෙන තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා 2012 සිට 2022 වර්ෂය දක්වා රු. මිලියන 364.64ක් වැය කර තිබුණි. මීට අදාළව පහත නිරීක්ෂණයන් ඉදිරිපත් කරනු ලැබේ. | | |
| (i) | ව්‍යාපෘතිය 2012 වර්ෂයේ සිට වර්ෂ 4ක් තුළ නිම කිරීමට අපේක්ෂා කර තිබුණ නමුත් විගණිත දිනය වූ 2023 අප්‍රේල් 30 වන විටත් ප්‍රධාන ජලාශයේ හෝ ඇළ මාර්ගයේ ඉදිකිරීම් කටයුතු කිසිවක් ආරම්භ කර නොතිබුණි. | ව්‍යාපෘතිය සඳහා පරිසර ඇගයීම් වාර්තා අනුමත වූයේ 2021.05.03 වන දින අතර මේ වන විට ප්‍රධාන ජලාශයේ සැලසුම් කටයුතු අවසන් කර ඇති අතර ප්‍රධාන ඇළෙහි සහ අතු ඇළවල් පද්ධතියෙහි සැලසුම් කටයුතු සියයට 30 ක් පමණ මේ වන විට නිමකර ඇත. අදාළ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට නොහැකි වූයේ රට තුළ උද්ගත වූ ආර්ථික අර්බුදය හේතුවෙන්ය. | ව්‍යාපෘතීන්හි මූලික කාර්යයන් වූ පරිසර ඇගයීම් ශක්‍යතා අධ්‍යනය හා ව්‍යාපෘති සැලසුම් සැකසීම ව්‍යාපෘති කාර්යයන් ආරම්භ කිරීමට පෙර සිදු කළ යුතුය. නොපමාව ව්‍යාපෘතිය ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | ව්‍යාපෘතියට අදාළව සිදුකළ ශක්‍යතා අධ්‍යන වාර්තාවක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. ව්‍යාපෘතිය සම්බන්ධයෙන් වූ පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව සඳහා මධ්‍යම පරිසර අධිකාරිය 2021 මැයි 03 දින ප්‍රධාන කොන්දේසි 15 ක් යටතේ වූ උප කොන්දේසි 94කට යටත්ව අනුමැතිය ලබා දී තිබුණ ද එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රායෝගිකත්වය හා ඒ සඳහා දැරීමට සිදුවන අතිරේක පිරිවැය පිළිබඳ කිසිදු විශ්ලේෂණයක් සිදුකර නොතිබුණි. | පාරිසරික ඇගයීම් වාර්තාවේ සඳහන් කොන්දේසි ක්‍රියාත්මක කිරීමට අතිරේක පිරිවැය පිළිබඳ වාර්තා සකසා නොමැති අතර ඉදිරියේදී ව්‍යාපෘතියෙහි කටයුතු ආරම්භ කරන විට ඒ සඳහා වාර්තාවක් පිළියෙල කරනු ඇත. | පාරිසරික බලපෑම් තක්සේරුව සඳහා අනුමැතිය ලබා නොගෙන හා ශක්‍යතා අධ්‍යනයන් සිදු කර පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයකින් තොරව ව්‍යාපෘති ආරම්භ නොකළ යුතුය. |
| (iii) | ව්‍යාපෘතිය සඳහා දරා තිබුණු රු. මිලියන 364.64 ක පිරිවැයෙන් වැඩි ප්‍රමාණයක් කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා, ව්‍යාපෘති කාර්යාලය පවත්වාගෙන යාම හා එහි නඩත්තු කටයුතු, ඉන්ධන වියදම් හා ගමන් වියදම් සඳහා දරා තිබුණි. | අදාළ කාලය තුළ ව්‍යාපෘතිය සඳහා වියදම් කර ඇති රු.මි.364.64ක මුදල, වියදම් කර ඇති ආකාරය පිළිබඳ සාරාංශ සටහනක් ඉදිරිපත් කර ඇත. | නොපමාව ව්‍යාපෘතියේ ඉදිකිරීම් ආරම්භ කළ යුතුය. |
| (iv) | වසර 10 සඳහා ව්‍යාපෘතියේ වාර්ෂික ගිණුම් වාර්තා සකස් කර නොතිබුණු අතර පරිපාලන වියදම් හා සංවර්ධන කටයුතු සඳහා වූ වියදම් වෙන් වෙන්ව හඳුනාගත හැකි පරිදි ගිණුම් පවත්වා ගෙනගොස් නොතිබුණි. | ඉදිරියේදී මෙය නිරවුල් කිරීමට ක්‍රියාමාර්ග ගනු ඇත. | ව්‍යාපෘති සංවර්ධන වියදම් හා පරිපාලන කටයුතු සඳහා වූ වියදම් වෙන් වෙන්ව හඳුනාගත හැකි පරිදි ගිණුම් පවත්වා ගතයුතුය. වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (v) | මහාපරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන් නැවත ක්‍රමෝපායකරණය හා කඩිනම් කිරීමේ (RAMP) කමිටුවේ නිර්දේශ අනුව කිවුල්ඔය ජලාශ ව්‍යාපෘතිය වසා දැමිය යුතු වුවද විගණිත දිනය වූ 2023 අප්‍රේල් 30 දක්වා එම ව්‍යාපෘති කාර්යාලය තවදුරටත් විවෘතව පැවතුණි. | පිළිතුරු ලබා දී නැත. | ව්‍යාපෘති කාර්යාලය මඟින් ඉටු කරන කාර්යයන් අධීක්ෂණයට ලක්කර තවදුරටත් පවත්වාගෙන යෑම පිළිබඳ තීරණය කළ යුතුය. |

## 3.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | භූගත ජල විමංසන තොරතුරු ජාලයක් ස්ථාපිත කිරීම<br>වකුගඩු රෝගය විශාල වශයෙන් ව්‍යාප්ත වී ඇති අනුරාධපුරය සහ පොළොන්නරුව වැනි තෝරා ගත් දිස්ත්‍රික්ක කිහිපයක නියමු ව්‍යාපෘතියක් ලෙස භූගත ජල විමංසන පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සඳහා පිරිවැය යුරෝ 20,629,921.18 හෙවත් රු.මිලියන 3,628.39 ක් වන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට වාරිමාර්ග හා ජල සම්පත් අමාත්‍යාංශ ලේකම් විසින් 2017 ඔක්තෝබර් 03 දින ගිවිසුමකට එළඹ තිබුණි. ව්‍යාපෘතියේ පිරිවැයෙන් සියයට 85 නෙදර්ලන්තයේ රේබෝ බැංකුවෙන් මාසිකව (Rabo Bank) EURIBOR + 1.45%ක් වූ සහන පොලී අනුපාතයක් මත සහන ගෙවීම් කාලයක් සහිතව ශ්‍රී ලංකා රජය විසින් ලබා ගෙන තිබුණි. ශ්‍රී ලංකා රජය විසින් දැරිය යුතු ඉතිරි සියයට 15 හැටන් නැෂනල් බැංකුව වෙතින් වසර 3 ක සහන කාලයක් සහිතව 2025 දෙවන අර්ධ වර්ෂයේ සිට වසර 15 කින් ගෙවා නිම කළ යුතු ණය මුදලක් ලෙස ලබා ගෙන තිබුණි. පහත දක්වා ඇති කරුණු අනුව ව්‍යාපෘතිය සඳහා දරන ලද පිරිවැයට ප්‍රමාණවත් පරිදි ප්‍රතිලාභ ලබා ගැනීමෙන් තොරව ඉදිරි වසර 15 ක් තුළ ණය ගෙවීමට රජයට සිදු වී තිබුණි. | පිළිතුරු ලබා දී නැත. | ශක්‍යතා අධ්‍යනයේදී සිදුකළ පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයේදී අපේක්ෂිත ප්‍රතිලාභ ගණනය සඳහා පාදක කර ගත් නිර්ණායකයන්ට අනුකූලව ව්‍යාපෘතියේ මෙහෙයුම් සිදු කරනු ලබන බවට වගබලා ගත යුතුය. ඒ පිළිබඳව විධිමත් වාර්තාකරණයක් හා සමීප පසු විපරමක් පැවැත්විය යුතුය. |
| (i) | වසර 3 ක් වූ ව්‍යාපෘති කාලය වසර 2 කින් දීර්ඝ කිරීමෙන් පසු 2022 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ කටයුතු නිම කර තිබුණු නමුත් ව්‍යාපෘතිය යටතේ ඉදිකළ යුතුව පැවති අත්‍යවශ්‍ය අංගයක් වූ දත්ත මධ්‍යස්ථානය ඉදිකර නොතිබීම හේතුවෙන් ව්‍යාපෘතියේ මූලික අරමුණු හා අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගත නොහැකි වී තිබීම. | ව්‍යාපෘති ගිවිසුම අනුව දත්ත මධ්‍යස්ථානය සඳහා ජල සම්පත් මණ්ඩල කාර්යාලය පිහිටි හෙක්ටර් කොබ්බෑකඩුව මාවතේ 6000ft ගොඩනැගිල්ලක් ඉදිකළ යුතු වූ අතර මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම කළ නොහැකි වුවද ව්‍යාපෘති අරමුණු සහ අවශ්‍යතාවයන් අනුව රත්මලාන වැඩබිම් කාර්යාලයෙහි දත්ත මධ්‍යස්ථානය ස්ථාපනය කර කටයුතු කරගෙන ගනු ලබයි. | ව්‍යාපෘතියේ ඉටු නොකළ කාර්යයන් සඳහා ගෙවන ලද අත්තිකාරම් මුදල හා ඊට අදාළ පොලිය ගණනය කර ණය මුදලෙන් අඩු කර ගැනීමට කටයුතු කළ යුතුය. දත්ත මධ්‍යස්ථානය අත්‍යවශ්‍ය අංගයක් බැවින් එය |

| | | | |
|---|---|---|---|
| | | | ස්ථාපිත කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | ව්‍යාපෘති ගිවිසුම අනුව යුරෝ 3,094,488.18 ක් වූ සියයට 15ක වැඩ අත්තිකාරම් මුදල ව්‍යාපෘතිය ආරම්භයේම ශ්‍රී ලංකා රජය විසින් ගෙවිය යුතු වූ හෙයින් එම මුදලට සමාන ණය මුදලක් ලංකාවේ හැටන් නැෂනල් බැංකුව වෙතින් ලබා ගෙන අදාළ අත්තිකාරම් මුදල ගෙවා තිබීම හා ඒ තුළ දත්ත මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වූ පිරිවැයද ඇතුළත්ව පැවතීම. | ව්‍යාපෘතිය මඟින් යෝජිත වූ දත්ත මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදි කිරීමට නොහැකි වීම හේතුවෙන් යුරෝ 433,288 ක් ඉතිරි වූ අතර ණය ගිවිසුමට අනුකූලව එම මුදල ණය වාරික වලින් සමානුපාතිකව අඩු කිරීම, ණය ගිවිසුමෙහි ඡේද 5 හි 5.2 වගන්තිය අනුව විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරනු ඇත. තවද රජය විසින් විදේශ ණය ගෙවීම නැවැත්වීම හේතුවෙන් මේ වන විට ණය වාරික ගෙවීම අත්හිටුවා ඇති බැවින් නැවත වාරික ගෙවීම ආරම්භ කිරීමෙන් පසුව ණය ගිවිසුමට අනුකූලව අදාළ ආපසු ගෙවීමේ ව්‍යුහය (Repayment Structure) සංශෝධනය වනු ඇති බවත් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් දන්වා ඇත. | ණය ආපසු ගෙවීමේ ව්‍යුහය (Repayment Structure) සංශෝධනය කර වැය නොකළ ණය මුදල් ප්‍රමාණය අඩු කරගෙන ඇති බව තහවුරු කරගත යුතුය. |
| (iii) | ව්‍යාපෘතිය සඳහා වූ ප්‍රතිපාදනයන්ගෙන් යුරෝ 433,228.15 ක් ඉතිරිව තිබූ අතර එම වටිනාකමද ඇතුළත්ව ශ්‍රී ලංකා රජය විසින් අත්තිකාරම් මුදල් ගෙවා තිබුණි. ඒ අනුව යුරෝ 509,687 කට අදාළ වැඩකටයුතු කොන්ත්‍රාත්කරු විසින් ඉටුකර නොතිබීම පිළිබඳ මහාභාණ්ඩාගාරය දැනුවත් කර නොතිබීම හේතුවෙන් සම්පූර්ණ ණය මුදලට අදාළ වාරිකය වූ යුරෝ 876,771.65 බැගින් 2021 සැප්.23 හා 2022 මාර්තු 23 යන දිනයන්හිදී මහා භාණ්ඩාගාරය විසින් ගෙවා තිබීම. | ණය ගිවිසුම අනුව සම්පූර්ණ ණය මුදල භාවිතයට නොගන්නේ නම් ඉතිරි වන මුදල විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් ණය ආපසු ගෙවීමේ වාරික වලින් සමානුපාතිකව අඩු කරනු ඇත. රජය විසින් විදේශ ණය ගෙවීම නැවැත්වීම හේතුවෙන් මේ වන විට ණය වාරික ගෙවීම අත්හිටුවා ඇති බැවින් නැවත වාරික ගෙවීම ආරම්භ කිරීමෙන් පසුව ණය ගිවිසුමට අනුකූලව අදාළ ආපසු ගෙවීමේ ව්‍යුහය සංශෝධනය වනු ඇති බවත් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් දන්වා ඇත. | ණය ආපසු ගෙවීමේ ව්‍යුහය (Repayment Structure) සංශෝධනය කර වැය නොකළ ණය මුදල් ප්‍රමාණය අඩු කරගෙන ඇති බව තහවුරු කරගත යුතුය. |
| (iv) | අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ තාක්ෂණ ඇගයීම් කමිටුව ව්‍යාපෘතියේ BOQ අයිතමයන් වෙන් වෙන් වශයෙන් අධීක්ෂණයට ලක් කර නිර්දේශ ඉදිරිපත් කර තිබුණි. එහිදී BOQ අයිතම අංක 33 ප්‍රකාරව භූගත ජලයේ නයිට්‍රේට් සාන්ද්‍රණය මැනීම සඳහා යොදා ගන්නා Nitrate Sensor | නයිට්‍රේට් සාන්ද්‍රණය මනිනු ලබන (SDI 12Prepared AP Light + Nitrate) උපකරණ වර්ගය භාවිතා කරන්නේ නම් එම උපකරණ අවම වශයෙන් සති දෙකකට වරක් ක්‍රමාංකණය (Calibrate) කළ යුතු බව කොන්ත්‍රාත් සමාගම සමඟ පැවති සාකච්ඡාවේදී අනාවරණය වූ | මෙවැනි සංශෝධන සඳහා තාක්ෂණ ඇගයීම් කමිටුවේ හා ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබාගත යුතු බැවින් එසේ නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන |

| | | | |
|---|---|---|---|
| | 30 ක් සහ BOQ අයිතම 29 ප්‍රකාරව භූගත ජල මට්ටම හා උෂ්ණත්වය මනින උපකරණ (Cera – Driver 10 meter) 90 ක් සවි කිරීමට නිර්දේශ කර තිබුණි. එසේ වුවද ව්‍යාපෘති අධ්‍යක්ෂකගේ අංක PD/GWMNP/2021/39 හා 2021 ජනවාරි 25 දිනැති ලිපිය මඟින් BOQ අයිතම 33 හි ඇතුළත් උපකරණ 30 සහ BOQ අයිතම 29 හි ඇතුළත් උපකරණ 90 ඉවත් කොට ඒ වෙනුවට භූගත ජල මට්ටම, උෂ්ණත්වය හා විද්‍යුත් සන්නායකතාවය මනිනු ලබන (CTD – Driver 10 meter) උපකරණ 120 ක් සවිකිරීමට කොන්ත්‍රාත්කරු සමඟ සාකච්ඡා කර ඉංජිනේරු ඇස්තමේන්තු සංශෝධනය කර තිබුණි. එසේ වුවද ඒ සඳහා තාක්ෂණ ඇගයීම් කමිටුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | අතර ඒ සඳහා එම උපකරණ සවිකරනු ලබන ස්ථාන කරා සති දෙකකට වරක් යායුතු විය. මේ සඳහා විශාල ප්‍රවාහන වියදමක් දැරීමට සිදු වන්නේය. අනෙකුත් සංඝටක මනිනු ලබන උපකරණ ක්‍රමාංකණය කිරීම සහ කාලාන්තර සාම්පල් ගැනීම සඳහා මාස තුනකට වරක් අදාළ පරීක්ෂණ ස්ථානවලට යාම ප්‍රමාණවත් බැවින් එම අවස්ථාවේදීම නයිට්‍රේට් මැනුම් සඳහා ජල සාම්පල ලබාගැනීම වඩාත් ඵලදායක බව තීරණය විය. ජලයේ නයිට්‍රේට් සාන්ද්‍රණය වෙනස්වීම සඳහා දීර්ඝ කාලයක් ගතවන බැවින් මාස තුනකට වරක් නයිට්‍රේට් මැනීම සිදු කිරීම මඟින් විශාල ප්‍රවාහන වියදමක් ඉතිරි කර ගැනීමට හැකිවනු සේම එම උපකරණයන්හි ක්‍රමාංකන සහ නඩත්තු වියදමද මඟ හැරේ. එසේම එම උපකරණයන්හි ජීව කාලයද CTD diver උපකරණයට වඩා අඩු අතර CTD diver මගින් භූගත ජලයේ විද්‍යුත් සන්නායකතාවයද මැනීමට හැකියාව පවතී.<br>එම සංශෝධනය හේතුවෙන් ව්‍යාපෘතිය මඟින් විමංසනය කිරීමට අපේක්ෂා කරනු ලබන පරාමිතීන් වල කිසිදු වෙනසක් සිදු නොවන බැවින් සහ ව්‍යාපෘති අරමුණු වලට හානියක් සිදු නොවන බැවින්, මෙය විචලනයක් (Variation) ලෙස සලකා කටයුතු කරන ලදී. | සංග්‍රහයේ II වන කාණ්ඩයේ XLVIII වන පරිච්ඡේදයේ 29 වගන්තිය යටතේ විනයානුකූලව ක්‍රියාමාර්ග ගත යුතුය. අවශ්‍යතාවය නියමාකාරයෙන් හඳුනා ගැනීමෙන් පසු ප්‍රමාණ පත්‍ර සැකසීමට කටයුතු කළ යුතුය. |
| (v) | ව්‍යාපෘතිය මඟින් භූගත ජල පර්යේෂණ සඳහා වූ අධිතාක්ෂණික උපකරණ සවි කර ඉදිකරන ලද නළලිං 190 ක් හා ඊට අදාළ නඩත්තු උපකරණ විධිමත් පරිදි ජල සම්පත් මණ්ඩලයට පැවරීම, කොන්ත්‍රාත් ගිවිසුම යටතේ වූ වැඩ අවසන් කිරීමේ වාර්තාව නිකුත් කිරීම, ගිණුම් පියවීම ඇතුළු කාර්යයන් නිම කොට ව්‍යාපෘතිය අවසන් කර, අදාළ ලේඛන ව්‍යාපෘතියේ අනාගත මෙහෙයුම් කටයුතු පැවරෙන ජල සම්පත් මණ්ඩලය වෙත විධිමත්ව පවරා දී නොතිබුණි. | ව්‍යාපෘතියට ලැබී ඇති ස්ථාවර වත්කම් ජල සම්පත් මණ්ඩලය විසින් භාර ගෙන ඇතත් පාරිභෝගික ද්‍රව්‍ය භාර ගැනීම මේ දක්වා ප්‍රමාද වී ඇත. එමෙන්ම ඉදි කරන ලද පරීක්ෂණ නළ ළිං 190 ට අදාළ අත් පොත් සහ ව්‍යාපෘතියට අදාළ ලිපි ගොනු භාර දීමට කටයුතු සලසා දෙන ලෙස ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් ජල සම්පත් මණ්ඩලය වෙත කරන ලද ඉල්ලීමට මේ දක්වා ප්‍රතිචාරයක් නොමැත. මේ කරුණු හේතුවෙන් | වැඩ අවසන් වාර්තා නිකුත් කිරීම, ගිණුම් පියවීම ඇතුළු කාර්යයන් නිම කොට ව්‍යාපෘතිය විධිමත්ව අවසන් කර අදාළ ලේඛන ව්‍යාපෘතියේ අනාගත මෙහෙයුම් කටයුතු පැවරෙන ජල සම්පත් මණ්ඩලය වෙත විධිමත්ව පවරා දීමට කටයුතු කළ යුතුය. වත්කම් භාර ගැනීමෙන් |

| | | |
|---|---|---|
| | ව්‍යාපෘතියෙහි වැඩ අවසන් වාර්තා නිකුත් කිරීම සහ ගිණුම් පියවීමට නොහැකි තත්වයක් උද්ගතව ඇති බව ව්‍යාපෘතියෙන් දන්වා ඇත. | පසු කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත වාර්තා කළ යුතු බවට ජල සම්පත් මණ්ඩලයට නියම කළ යුතුය. |

### 3.3 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහාපරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන් නැවත ක්‍රමෝපායකරණය හා කඩිනම් කිරීමේ (RAMP) කමිටුවේ නිර්දේශ ප්‍රකාරව අග්‍රාමාත්‍ය ලේකම්වරයා විසින් 2023 ජනවාරි 13 දින වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම්වරයා වෙත ඉදිරිපත් කර තිබුණු ලිපිය අනුව වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කර තිබුණු ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 333,569ක් හා ඇ.ඩො.මිලියන 690ක් වූ ව්‍යාපෘති 9ක් 2023 වර්ෂයේ සිට ක්‍රියාත්මක නොකිරීමට තීරණය කර තිබුණි. 2022 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 203,159 පිරිවැයක් දරා තිබුණු මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී පැවති දුර්වල කළමනාකරණය හේතුවෙන් සැලසුම් කළ පරිදි නිම කිරීමකින් තොරව අත්හැර දැමීමට සිදුව තිබුණි. ඒ අතරින් ව්‍යාපෘති 7ක ප්‍රගතිය සියයට 0 සිට සියයට 13.16ක් වූ අවම මට්ටමක විය. | ව්‍යාපෘතිවල 2022 වසර තුළ අවසන් කළ හැකි ක්‍රියාකාරකම් පමණක් නිම කර, ව්‍යාපෘති කටයුතු අවසන් කර ඇත. ඒ අනුව එම ව්‍යාපෘති සියයට 100 ක් භෞතිකව වැඩ නිමකර නොමැති අතර, භෞතිකව වැඩ අවසන් කළ ව්‍යාපෘති ලෙස සලකා ඇත. ග්‍රාමීය වැව් සංවර්ධනයට අදාළ ප්‍රගති වාර්තා දිස්ත්‍රික් මට්ටමින් හා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වත්කම් කළමනාකරණ අංශය මඟින් ලබා දුන් තොරතුරු පදනම් කරගනිමින් වාරිමාර්ග අමාත්‍යාංශයේ සැලසුම් අංශය විසින් සකස් කර ඉදිරිපත් කර ඇති අතර එම ව්‍යාපෘති අවලංගු කර ඇත්තේ ඒ ඒ අවස්ථාවල අමාත්‍යාංශ මට්ටමින් හා ජාතික මට්ටමින් ගනු ලැබූ තීරණ පදනම් කර ගනිමිනි. | නව ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කිරීමට ප්‍රථම දැනට වැඩ ආරම්භ කර ඇති හා සැලකිය යුතු පිරිවැයක් දරා ඇති ව්‍යාපෘතීන්හි කටයුතු නිම කිරීමෙන් ලබා ගත හැකි ආර්ථික ප්‍රතිලාභ පිළිබඳ විශ්ලේෂණය කර ප්‍රමුඛතා පදනමක් මත හෝ අවසන් කිරීම සඳහා නිර්දේශ සහිතව අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කළ යුතුය. |
| (ආ) | **තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය** | | |
| | මේ සඳහා ඉදිරිපත්කර තිබුණු අංක 14/1281/508/015/ටීබීආර් දරන අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2014 සැප්තැම්බර් 18 දින ලැබී තිබුණු අනුමැතිය අනුව ආරම්භකර තිබුණු මෙම ව්‍යාපෘතියේ කටයුතු, උමාඔය ව්‍යාපෘතිය සඳහා ඇති වූ ජනතා විරෝධය මත ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි. ව්‍යාපෘතිය සඳහා 2017 දෙසැම්බර් මස චීනයේ EXIM බැංකුව සමඟ ණය ගිවිසුමක් අත්සන් | තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය උමාඔය ව්‍යාපෘතියත් සමඟ ක්‍රියාත්මක කළ යුතු ඉතා අත්‍යාවශ්‍ය ව්‍යාපෘතියක් වන අතර විදේශ අරමුදල් ලබා ගෙන ක්‍රියාත්මක කළ යුතු ව්‍යාපෘතීන් අතර ප්‍රමුඛත්වයෙන් පවතින ව්‍යාපෘතියකි. නමුත් මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන් නැවත ක්‍රමෝපායකරණ හා කඩිනම් කිරීමේ (RAMP) | ශක්‍යතා අධ්‍යනයේදී සිදුකළ පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයේදී අපේක්ෂිත ප්‍රතිලාභ ගණනය සඳහා පාදක කරගත් නිර්ණායකයන්ට අනුකූලව ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබන බවට |

| | | | |
|---|---|---|---|
| | කර තිබුණු අතර ව්‍යාපෘතියේ වැඩ කටයුතු ආරම්භ කර තිබුණද ණය ගිවිසුම ක්‍රියාත්මක නොවීම මත 2019 වර්ෂයේ කොන්ත්‍රාත් සමාගම ව්‍යාපෘතිය අතරමග නවතා ක්ෂේත්‍රයෙන් ඉවත් වී තිබුණි.<br>ශ්‍රී ලංකා ජනරජයේ මූල්‍ය ප්‍රතිපාදන මත 2020 වර්ෂයේදී නැවත ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කිරීමෙන් පසු මේ දක්වා රු.මිලියන 610ක් වැය කර තිබුණද ව්‍යාපෘතිය නවතා දැමීමට තීරණය කිරීම හේතුවෙන් මූලික අරමුණු යටතේ හඳුනාගෙන තිබූ ආර්ථික වාසි සැලසුම් ප්‍රකාරව ලබා ගැනීමට නොහැකි වී තිබූ අතර ව්‍යාපෘතිය සඳහා මෙතෙක් දරා ඇති පිරිවැයෙන් මේ දක්වා ජාතික ආර්ථිකයට කිසිදු දායකත්වයක් ලැබී නොතිබුණි. | කමිටුවේ නිර්දේශ මත රට තුළ පවතින ආර්ථික හා මූල්‍ය දුෂ්කරතා කෙරෙහි අවධානය යොමු කරමින් තල්පිටිගල ව්‍යාපෘතියේ කටයුතු තාවකාලික අත්හිටුවීමට තීරණය කර ඇතත් 2023.05.31 දිනෙන් පසුව වාරිමාර්ග දෙපාර්තමේන්තුවට පවරා එමගින් ව්‍යාපෘතියේ කටයුතු තවදුරටත් ක්‍රියාත්මක කරනු ලබයි.<br>මෙම ව්‍යාපෘතිය ආරම්භයේ සිට 2023 මැයි 31 දක්වා රු.මිලියන 610ක වියදමක් දරා ඇති අතර ව්‍යාපෘතියට අදාළ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා මෙම මුදල් ඵලදායි ලෙස යොදවා ඇත. | වගබලා ගත යුතුය. ඒ පිළිබඳව විධිමත් වාර්තාකරණයක් හා සමීප පසු විපරමක් සිදු කළ යුතුය. |
| (ඇ) | **දෙමටගල්ල හා කුඩාවිලච්චිය වැව් ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය**<br>මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කුඩාවිලච්චිය වැව සහ පලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දෙමටගල්ල වැව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා 2019 මැයි 29 දිනැති අංක අමප/19/1341/118/014 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව | | |
| (i) | ග්‍රාමීය වැව් 32ක් යටතේ හෙක්ටයාර 550ක් වගා කිරීම ඇතුළු ප්‍රතිලාභ රැසක් අරමුණු කර ගනිමින් දෙමටගල්ල වැව ප්‍රතිස්ථාපනය මෙන්ම පෝෂක ඇළක් ද සමඟින් හැවන් ඇල්ල අමුණ ප්‍රතිසංස්කරණය ආරම්භකර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා වසර 3ක් තුළ රුපියල් මිලියන 1.43ක් වැය කිරීමෙන් අනතුරුව මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන් නැවත-ක්‍රමෝපායකරණ හා කඩිනම් කිරීමේ(**RAMP**) කමිටුවේ නිර්දේශ ප්‍රකාරව ව්‍යාපෘතිය නවතා දැමීමට තීරණය කිරීම හේතුවෙන් මූලික අරමුණු යටතේ හඳුනාගෙන තිබූ | පිළිතුරු ලබා දී නැත. | නව ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කිරීමට ප්‍රථම දැනට වැඩ ආරම්භ කර ඇති හා සැලකිය යුතු පිරිවැයක් දරා මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන් නැවත-ක්‍රමෝපායකරණ හා කඩිනම් කිරීමේ (**RAMP**) කමිටුවේ නිර්දේශ හේතුවෙන් නවතා දමා ඇති ව්‍යාපෘතීන්හි කටයුතු නිම කිරීමෙන් ලබා ගත |

| | | | |
|---|---|---|---|
| | ආර්ථික වාසි සැලසුම් කළ පරිදි ලබා ගැනීමට නොහැකි වී තිබුණු අතර මෙතෙක් දරා ඇති පිරිවැයෙන් මේ දක්වා ජාතික ආර්ථිකයට කිසිදු දායකත්වයක් ලැබී නොතිබුණි. | | හැකි ආර්ථික ප්‍රතිලාභ පිළිබඳ විශ්ලේෂණය කර ප්‍රමුඛතා පදනමක් මත හෝ අවසන් කිරීම සඳහා නිර්දේශ සහිතව අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කළ යුතුය. |
| (ii) | අමාත්‍ය මණ්ඩලයේ තීරණයක් මත ප්‍රතිලාභ රසක් අරමුණු කර ගනිමින් 2019 වසරේ ආරම්භ කළ කුඩාවිලච්චිය ජලාශ ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය සඳහා වසරකදී රු.මිලියන 120.55ක් වැය කිරීමෙන් අනතුරුව මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන් නැවත-ක්‍රමෝපායකරණ හා කඩිනම් කිරීමේ**(RAMP)** කමිටුවේ නිර්දේශ මත නවතා දැමීමට තීරණය කිරීම හේතුවෙන් මූලික අරමුණු යටතේ හඳුනාගෙන තිබූ ආර්ථික, සමාජයීය, පාරිසරික වශයෙන් වූ වාසි සැලසුම්ගත පරිදි ලබා ගැනීමට නොහැකිව තිබුණි. | පිළිතුරු ලබා දී නැත. | නව ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කිරීමට ප්‍රථම දැනට වැඩ ආරම්භ කර ඇති හා සැලකිය යුතු පිරිවැයක් දරා මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන් නැවත-ක්‍රමෝපායකරණ හා කඩිනම් කිරීමේ **(RAMP)** කමිටුවේ නිර්දේශ හේතුවෙන් නවතා ඇති ව්‍යාපෘතීන්හි කටයුතු නිම කිරීමෙන් ලබා ගත හැකි ආර්ථික ප්‍රතිලාභ පිළිබඳ විශ්ලේෂණය කර ප්‍රමුඛතා පදනමක් මත හෝ අවසන් කිරීම සඳහා නිර්දේශ සහිතව අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කළ යුතුය. |
| (ඇ) | අමාත්‍යාංශය යටතේ වූ ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව් ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය මඟින් 2021 වර්ෂයේ රු. මිලියන 4.25ක්ද, 2022 වර්ෂයේ රු. මිලියන 4.06ක්ද වශයෙන් රු. මිලියන 8.31ක වියදමක් දරා තිබුණු භෞතික ප්‍රගතිය සියයට 50ක් දක්වා වූ කොන්ත්‍රාත් 42ක් සමාලෝචිත වර්ෂය අවසානයේ අවලංගු කර තිබුණි. තවද එකතුව රු. මිලියන 236.55ක ප්‍රතිපාදන වෙන්කර තිබූ කොන්ත්‍රාත්තු 29ක්ද, ප්‍රතිපාදන වටිනාකම දක්වා නොතිබූ කොන්ත්‍රාත්තු 03ක්ද ක්‍රියාත්මක නොකර අවලංගු කර තිබූ අතර, අවලංගු කිරීමට තුඩු දුන් හේතු ප්‍රගති වාර්තාවට ඇතුළත් කර නොතිබුණි. | ග්‍රාමීය වැව් සංවර්ධනය හා අදාළ ප්‍රගති වාර්තා දිස්ත්‍රික් මට්ටමින් හා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වත්කම් කළමනාකරණ අංශය මඟින් ලබා දුන් තොරතුරු පදනම් කරගනිමින් වාරිමාර්ග අමාත්‍යාංශයේ සැලසුම් අංශය විසින් සකස් කර ඉදිරිපත් කර ඇත. එම ව්‍යාපෘති අවලංගු කිරීම සිදුකර ඇත්තේ ඒ ඒ අවස්ථාවල අමාත්‍යාංශ මට්ටමින් හා ජාතික මට්ටමින් ගනු ලැබූ තීරණ පදනම් කර ගනිමිනි. | කොන්ත්‍රාත් අවලංගු කිරීමට හේතුව ප්‍රගති වාර්තාවල නිශ්චිතව හෙළිදරව් කළ යුතුය. ඒ මත ඉදිරි ක්‍රියාමාර්ග තීරණය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | **ඇහැටුගස්වැව, වැලි ආර අමුණේ සිට කිරිඉබ්බන්වැව දක්වා වූ 2.7 KM ක පෝෂිත ඇළමාර්ගය ඉදිකිරීම.**<br>ඇහැටුගස්වැව ඒකකයේ වැලි ආර අමුණේ සිට කිරිඉබ්බන්වැව දක්වා දිවෙන 2.7 KM ක දුර ප්‍රමාණයකින් යුක්ත පෝෂිත ඇළමාර්ගය ඉදිකිරීම 2018 අගෝස්තු මස පෞද්ගලික කොන්ත්‍රාත්කරුවෙකුට රු.මිලියන 3.4කට පවරා තිබුණි. එම ඇළ මාර්ගයේ ඉදිකිරීම් කටයුතු වලින් සියයට 60ක් පමණ අවසන්ව පැවතියදී අතරමඟ නවතා දමා තිබුණද කොන්ත්‍රාත්කරුගෙන් වන්දි අයකර ගැනීමට හෝ කොන්ත්‍රාත්කරු අසාදු ලේඛන ගත කිරීමට කටයුතු කර නොතිබුණි. අදාළ ඇළ මාර්ගයේ ඉතිරි කොටස ඉදිකිරීම සෘජු ශ්‍රම ක්‍රමය යටතේ 2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක කර තිබුණු නමුත් මේ දක්වා නිමකර නොතිබුණි. මේ හේතුවෙන් අදාළ පිරිවැය අනාර්ථික තත්ත්වයට පත්වීමට අමතරව ඇළ පතුලේ වලවල් වල ජලය රැඳී තිබීම, ඇහැටුගස්වැව ගම්මානය හරහා ඇළ මාර්ගය දිවීම හේතුවෙන් පදිංචිකරුවන්ගේ ඉඩම් දෙකඩ වී තිබීම, නිසි ශක්‍යතා අධ්‍යනයකින් හා සැලසුම් කිරීමකින් තොරව ක්‍රියාත්මක කර තිබීම හේතුවෙන් ඇළෙහි ඇතැම් ස්ථානයන්හි ගැඹුර අඩි 30ක් පමණ වීම, එවැනි ස්ථාන ආවරණය කිරීම සඳහා කටයුතු කර නොතිබීම හේතුවෙන් ජන ජීවිතයට තර්ජන එල්ල වී තිබීම යන සමාජ හා පාරිසරික ගැටලු නිර්මාණය වී තිබුණි. | පිළිතුරු ලබා දී නැත. | නිසි ශක්‍යතා අධ්‍යනයකින් හා සැලසුම් කිරීමකින් තොරව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ජන ජීවිතයට තර්ජන එල්ල කළ, සමාජ හා පාරිසරික ගැටලු නිර්මාණය කළ සහ අදාළ කොන්ත්‍රාත්කරුගෙන් වන්දි අයකර ගැනීමට හා අසාදු ලේඛන ගත කිරීමට කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩය යටතේ විනයානුකූලව ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.4 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) **උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය**<br><br>ව්‍යාපෘතිය 2008 වර්ෂයේ ආරම්භ කර වසර 07කින් එනම් 2015 නොවැම්බර් 15 දින නිම කිරීමට මූලිකව අපේක්ෂා කර තිබුණ ද අවස්ථා 8කදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත 2021 ජූනි 30 දක්වා කාලය දීර්ඝ කර තිබුණි. ඉරාන ෆරාබ් සමාගම 2008 අප්‍රේල් 28 දින ඉංජිනේරු, ප්‍රසම්පාදන හා ඉදිකිරීම් (EPC) කොන්ත්‍රාත් ක්‍රමය යටතේ කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබුණු අතර සංශෝධිත මුළු පිරිවැය ඇස්තමේන්තුව ඇමරිකානු ඩොලර් මිලියන 529.06 ක් හෙවත් රුපියල් මිලියන 74,325.75ක් විය. උක්ත ගිවිසුම යටතේ 2023 අප්‍රේල් 30 දිනට රු.මිලියන 70,585.08ක වැඩ සහතික කොට ගෙවා තිබුණි. ව්‍යාපෘතිය සඳහා අරමුදල් ඉරාන අපනයන සංවර්ධන බැංකුව මඟින් මූල්‍යනය කිරීමට යටත්ව අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි තරඟකාරී මිල ගණන් කැඳවීමකින් තොරව කොන්ත්‍රාත්කරු තෝරාගෙන තිබුණද, 2013 වර්ෂයේදී ඉරානය වෙත පනවන ලද ආර්ථික සම්බාධක හේතුවෙන් ඉරාන අපනයන සංවර්ධන බැංකුව විසින් ණය මුදල අත්හිටුවා තිබුණි. ව්‍යාපෘතියට අදාළව පහත සඳහන් නිරීක්ෂණයන් ඉදිරිපත් කෙරේ. | | |
| (i) ඇමරිකානු ඩොලර් මිලියන 50ක් හෙවත් රු. මිලියන 6,522.85ක් විදේශීය ණය ගිවිසුම මඟින් මූල්‍යනයෙන් අනතුරුව ව්‍යාපෘතියේ මේ දක්වා පිරිවැය වූ ඇමරිකානු ඩොලර් මිලියන 437.11 ක් හෙවත් රු. මිලියන 71,056.14 ක් ශ්‍රී ලංකා රජයේ අරමුදල් වලින් මූල්‍යකරණය කර | 2007 නොවැම්බර් 27 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ඉරාන ඉස්ලාමීය ජනරජය අතර අත්සන් කරන ලද එකඟතා ගිවිසුම ප්‍රකාරව ඉරාන අපනයන බැංකු (EDBI) අරමුදල් යටතේ උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කරන ලද අතර ඉරාන | ව්‍යාපෘතීන්හි ක්‍රියාකාරීත්වය තුළ මෙවැනි ව්‍යුහාත්මක වෙනස්කම් සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීමේදී, රජයට ලබාගත හැකි තරඟකාරී වාසි පිළිබඳ |

| | | | |
|---|---|---|---|
| | තිබුණි. මෙම ව්‍යාපෘතිය දේශීය අරමුදල් මඟින් ඉදිරියට ගෙන යාම පිළිබඳ තීරණය කිරීමේදී ජාත්‍යන්තර තරඟකාරී මිල ගණන් කැඳවීම තුළින් ශ්‍රී ලංකා රජයට ලබාගත හැකිව තිබූ තරඟකාරී වාසි පිළිබඳ තක්සේරු කිරීමක් සිදුකර අමාත්‍ය මණ්ඩලය දැනුවත් කර නොතිබුණි. | ඉස්ලාමීය රජය විසින් ප්‍රධාන කොන්ත්‍රාත්කරු වශයෙන් ඉරානයේ ෆරාබ් සමාගම නම් කරන ලදී. එසේම, එම ක්‍රියාවලිය සඳහා එවකට අමාත්‍ය මණ්ඩල විසින් අනුමැතිය ලබා දී ඇත.<br>ඒ අනුව, ඒ අවස්ථාවේදී අදාළ කොන්ත්‍රාත්තුව සඳහා තරඟකාරී මිල ගණන් කැඳවූවා නම් ශ්‍රී ලංකා රජයට විය හැකිව තිබූ ලාභය/ පාඩුව එම සිදුවීමෙන් වසර 14කට පසු වර්තමානයේදී ගණනය කිරීම සඳහා දැනට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය තුළ ඒ සම්බන්ධ සුදුසුකම් සහිත නිලධාරීන් නොමැති අතර ඒ සඳහා ආර්ථික විද්‍යා, මූල්‍ය කටයුතු, ප්‍රසම්පාදන කටයුතු ආදී විෂයන් පිළිබඳ පුළුල් හා ප්‍රායෝගික හැකියාවක් ඇති විද්වත් මණ්ඩලයකට යම් කාලපරිච්ඡේදයක් සහිතව පැවරුමක් වශයෙන් ලබාදී එම තොරතුරු ලබා ගැනීම වඩා උචිත වේ. එලෙස ලබා ගන්නා තොරතුරු ඇතුළත් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් මඟින් අමාත්‍ය මණ්ඩලය දැනුවත් කිරීම වඩා යෝග්‍ය බව පෙනේ. | තක්සේරු කර අමාත්‍ය මණ්ඩලය දැනුවත් කළ යුතුය. |
| (ii) | 2023 මැයි 15 දින වන විට ව්‍යාපෘතියේ ප්‍රමාද කාලය වසර 7කුත් මාස 6ක් වූ අතර උක්ත ප්‍රමාදය හේතුවෙන් ව්‍යාපෘතිය මඟින් අපේක්ෂා කර තිබුණු ප්‍රතිලාභ අත් කර ගැනීමට නොහැකි වී තිබුණි. එහිදී විදුලි බල ජනන පද්ධතියට මෙගාවොට් 120 ක විදුලි බලයක් එකතු කිරීම තුළින් දිනකට විදුලිබල මණ්ඩලයට රු. මිලියන 55 කට නොවැඩි මුදලක් ඉතිරිවන බව ගණන් බලා තිබුණි. ඒ අනුව ව්‍යාපෘතිය වසර 7 1/2 ක් ප්‍රමාදවීම තුළින් සිදුව තිබූ පාඩුව රු. මිලියන 150,562 ක් වී තිබුණි. | ව්‍යාපෘතිය නියමිත පරිදි 2015 නොවැම්බර් මස නිම කොට ජාතික විදුලි බල පද්ධතියට මෙගා වොට් 120ක ජලවිදුලි ධාරිතාවක් එක් කළේ නම්, එදා සිට අද දක්වා විදුලි බල මණ්ඩලයට ලැබෙන ප්‍රතිලාභය නිවැරදිව ගණන් බැලීම විදුලි බල මණ්ඩලයේ ඒ පිළිබඳ නිපුණතා ඇති ඉංජිනේරු පිරිසක් විසින් සිදු කළ යුතු අතර ඒ පිළිබඳව ඔවුන් වෙත දැනුම්දී එම ප්‍රතිලාභ පිළිබඳ තොරතුරු ලබා ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ඇත. | කාලය දීර්ඝ කිරීම අනුමත කිරීමට පෙර ව්‍යාපෘති ප්‍රමාදවීමේ ආවස්ථික පිරිවැය ගණනය කර ගිවිසුම් ප්‍රකාරව කොන්ත්‍රාත්කරු වෙත සන්නිවේදනය කොට අදාළ පිරිවැය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | මීට අදාළ ගිවිසුම ප්‍රකාරව ව්‍යාපෘතිය 2008 වර්ෂයේ ආරම්භකර වසර 7කින් එනම් 2015 නොවැම්බර් 15 දින නිම කිරීමට මූලිකව අපේක්ෂාකර තිබුණද අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 7ක් මගින් කාලය දීර්ඝ කිරීම් කර තිබුණි. එකී අමාත්‍ය මණ්ඩල තීරණ මගින් දීර්ඝ කරන ලද කාල සීමාව තුළ රජයට අමතර වියදමකින් තොරව සියලු ඉදිකිරීම් නිමකර ව්‍යාපෘතිය විධිමත්ව රජය වෙත භාරදීමේ කොන්දේසි වලට යටත්ව කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. ඒ පිළිබඳ නොසලකා කොන්ත්‍රාත්කරු වෙත කාල දීර්ඝයන් ලබා දී තිබුණු අතර එම කාලසීමාව තුළ අපේක්ෂිත ප්‍රතිලාභ ලැබී නොතිබුණු නමුත් ඒ මගින් සේවා යෝජක වන ශ්‍රී ලංකා ජනරජයට සිදුවී ඇති පාඩුව ගණනය කොට EPC කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි ප්‍රකාර කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනීමේ හැකියාව පිළිබඳ අවධානය යොමු කර නොතිබුණි. ව්‍යාපෘතියට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශ 66ක් ඉදිරිපත් කර තිබුණු නමුත් එම කිසිදු අවස්ථාවකදී ඒ පිළිබඳ අමාත්‍ය මණ්ඩලය දැනුවත් කිරීමටද අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි. | ව්‍යාපෘතිය ප්‍රමාදවීමට හේතූන් ලෙස ජල කාන්දුව**,** කොවිඩ් වසංගතය වශයෙන් වූ නොයෙක් අවිනිශ්චිත තත්වයන් ඇතිවීම පෙන්වා දිය හැකි අතර එකී කරුණු නිසා ප්‍රමාද වූ කාල පරාසය සඳහා කොන්ත්‍රාත්කරු විධිමත්ව කාලය දීර්ඝ කරගැනීමට කටයුතු කර ඇති බැවින් ව්‍යාපෘති ප්‍රමාදය සඳහා ආවස්ථික පිරිවැය ගණනය කිරීම අවශ්‍ය නොවේ. | දීර්ඝ කරන ලද කාලය තුළ අපේක්ෂිත ප්‍රතිලාභ නොලැබීම මගින් සේවා යෝජක වන ශ්‍රී ලංකා ජනරජයට සිදුවී ඇති පාඩුව EPC කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි ප්‍රකාර කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. මෙම ව්‍යාපෘතියට අදාළ ඉදිරි අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීමේදී මේ පිළිබඳ තොරතුරු අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කළ යුතුය. |
| (iv) | කොන්ත්‍රාත්කරු විසින් ව්‍යාපෘතියේ ඉදිකිරීම් සඳහා අවශ්‍ය ඉඩම් සඳහා ප්‍රවිෂ්ඨවීමේ අයිතිය ලබා දීමේ ප්‍රමාදය**,** නිම කළ වැඩ සඳහා ඉදිරිපත් කළ බිල්පත් ගෙවීමේ ප්‍රමාදය සහ ඉදිකිරීම් වැඩබිම සඳහා ලබා දිය යුතුව තිබුණු දත්ත ලබා දීමේ ප්‍රමාදය වැනි කරුණු 05ක් සඳහා කොන්ත්‍රාත්කරුගේ ප්‍රමාද ගාස්තු හිමිකම වශයෙන් ඇමරිකානු ඩොලර් 181,337,171ක ප්‍රමාද ගාස්තුවක් රජයෙන් ඉල්ලා තිබුණි. අමාත්‍ය මණ්ඩලය විසින් මේ පිළිබඳ සොයා බලා නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස සාකච්ඡා සම්මුති කමිටුවක් පත් කර තිබුණු අතර එම කමිටු වාර්තාව මගින් කොන්ත්‍රාත්කරුගේ ප්‍රමාද ගාස්තු හිමිකම වශයෙන් ඇමරිකානු ඩොලර් 19,517,082 ක මුදලක් | නිරීක්ෂණය නිවැරදි වේ. | අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීමේදී තොරතුරු නිවැරදිව ඇතුළත් කිරීමට වගබලා ගත යුතු වේ. සාකච්ඡා සම්මුති කමිටු වාර්තාවේ සඳහන් ප්‍රමාද හිමිකම් සඳහා නිර්දේශිත මුදල අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ ඇමරිකානු ඩොලර් මිලියන 19.09ක් වැඩි කර දක්වා තිබීම සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම් වගකිව යුතු වේ. ඒ අනුව ලේකම් සම්බන්ධයෙන් විනයානුකූල ක්‍රියාමාර්ග ගත යුතුය. |

නිර්දේශ කර තිබුණි. ඊට අමතරව එහිදී, ඉරාන රජයට පනවා තිබුණු ආර්ථික සම්බාධක හා වෙනත් අනපේක්ෂිත දුෂ්කරතා හේතුවෙන් කොන්ත්‍රාත්කරු මුහුණ දෙනු ලබන මූල්‍යමය බාධාවන් සඳහා සානුකම්පිත හේතු මත අමාත්‍ය මණ්ඩලයේ කැමත්ත පරිදි කොන්ත්‍රාත්කරුට ඇමරිකානු ඩොලර් 19,094,795 ගෙවීම සඳහා සලකා බැලීමට සම්මුති සාකච්ඡා කමිටුව විසින් නිර්දේශ කර තිබුණි. 2021 ඔක්තෝබර් 31 දින මීට අදාළව ඉදිරිපත් කර තිබුණු අංක IR/2021/62 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් සාකච්ඡා සම්මුති කමිටුව විසින් නිර්දේශ කළ ප්‍රමාද ගාස්තුව වශයෙන් ඇමරිකානු ඩොලර් මිලියන 38.612ක් එනම් උක්ත පරිදි සානුකම්පිත හේතු මත ගෙවීම සලකා බැලීමට කමිටුව යෝජනා කළ මුදලද ඇතුළත්ව, කමිටුව විසින් නිර්දේශිත වටිනාකම ඇමරිකානු ඩොලර් මිලියන 38.612 ක් වශයෙන් අර්ථ දක්වා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කර තිබුණි.

(v) අමාත්‍ය මණ්ඩලය විසින් පත් කර තිබුණු සාමාජිකයන් 07 දෙදෙනෙකුගෙන් යුතු සම්මුති සාකච්ඡා කමිටුව සඳහා ව්‍යාපෘතිය ආරම්භයේ සිටම එම ක්‍රියාවලියට සම්බන්ධ වූ හා ඒ සම්බන්ධව පූර්ණ අවබෝධයෙන් යුතු නිලධාරීන් ඇතුළත් කර නොතිබීම හා ව්‍යාපෘතියට සෘජුව සම්බන්ධ නොවූ නිලධාරී කණ්ඩායමක් කමිටුව සඳහා පත්කර තිබීම නිරීක්ෂණය විය. කමිටුව විසින් අත්‍යාවශ්‍ය පාර්ශ්ව සමඟ ප්‍රමාණවත් සන්නිවේදනයක් සිදුකර නොතිබීම, ව්‍යාපෘතියේ කටයුතු මූලික ගිවිසුම්ගත කාලයට සමාන කාලයකින් ප්‍රමාද වී තිබියදී ඒ මගින් ශ්‍රී ලංකා ජනරජයට සිදුවී ඇති පාඩුව EPC කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව අයකර ගැනීමේ හැකියාව පිළිබඳ කිසිදු සැලකිල්ලක් දක්වා නොතිබීම, කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමේදී "රජය වෙත අමතර වියදමකින් තොරව දීර්ඝ කරන ලද කාලසීමාව තුළ සියලු

උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරු විසින් ඉල්ලා ඇති ප්‍රමාද ගාස්තු හිමිකම සම්බන්ධව සමාලෝචනය කිරීම සඳහා පත්කර ඇති කමිටුව ස්වාධීන, මධ්‍යස්ථ කමිටුවක් වීම අත්‍යවශ්‍ය බැවින් මෙවැනි කමිටුවක් පිහිටුවා ඇති අතර අදාළ කමිටු සාමාජිකයන් ව්‍යාපෘතියට සෘජුව සම්බන්ධ නොවුනත් අදාළ විෂයන්හි විශේෂඥ දැනුම ඇති අය වන අතර ව්‍යාපෘතිය හා ව්‍යාපෘති ක්‍රියාවලිය සම්බන්ධ සියලු තොරතුරු ව්‍යාපෘතියට සම්බන්ධ අදාළ නිලධාරීන්ගෙන් ලබාගෙන ගැඹුරින් අධ්‍යනය කොට නිගමනයන්ට එළඹ ඇති බැව් පෙනේ.

සම්මුති සාකච්ඡා කමිටුව විසින් වෘත්තිමය පරිචයන් නොසලකා නිර්දේශ ඉදිරිපත් කිරීම තුළින් අලාභ සිදු කිරීම හා නීතිවිරෝධී හැසිරීම පිළිබඳ කමිටු නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූල ක්‍රියාමාර්ග ගත යුතුය. තවද පරීක්ෂණ නිර්දේශ ප්‍රකාරව මෙම කරුණු සම්බන්ධයෙන් 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව නීතිය බලාත්මක කිරීමේ නියෝජිත ආයතන වෙත පැමිණිලි කළ යුතුය.

| | | | |
|---|---|---|---|
| | ඉදි කිරීම් නිම කර ව්‍යාපෘතිය විධිමත්ව රජය වෙත භාර දීම" යන කොදේසිය පනවා තිබූ නමුත් එම කොන්දේසිය පිළිබඳව සැලකිල්ලක් දක්වා නොතිබීම, කමිටු නිර්දේශය තුළ සානුකම්පිත හේතූන් මත අමාත්‍ය මණ්ඩලය කැමති නම්, ඇමරිකානු ඩොලර් 19,094,795ක අමතර ගාස්තුවක් ගෙවීමට නිශ්චිත නොවූ හා වෘත්තීමය භාවිතයෙන් තොර නිර්දේශ ඇතුළත් කොට තිබීම යන කරුණු හේතුවෙන් කමිටු නිර්දේශය සර්වග්‍රාහී කරුණු ආවරණයක් සිදු කර ඇති බවට සෑහීමකට පත්විය නොහැකි විය. | | |
| (vi) | 2015 නොවැම්බර් 15 දින සිට 2023 ජුනි 30 දක්වා ව්‍යාපෘති කාලය දීර්ඝ කර තිබුණු අතර කොන්ත්‍රාත් ගිවිසුමේ 8.7 වගන්තිය ප්‍රකාරව දිනකට කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 0.01 ක් වශයෙන් උපරිමය සියයට 5ක් දක්වා ප්‍රමාද ගාස්තු ලෙස ඇමරිකානු ඩොලර් මිලියන 26.453 ක් අයකළ හැකිව තිබුණද එම ප්‍රමාද ගාස්තු අය කරගෙන නොතිබුණු අතර ප්‍රමාද ගාස්තු ලෙස කොන්ත්‍රාත්කරුගෙන් ඇමරිකානු ඩොලර් මිලියන 6.6 ක් පමණක් අයකරගෙන තිබුණි. | උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වීම සම්බන්ධයෙන් කොන්ත්‍රාත් ගිවිසුමේ සඳහන් කොන්දේසි වලට අනුව එහි කොන්ත්‍රාත්කාර FARAB ආයතනයෙන් ප්‍රමාද ගාස්තු ලෙස ඇ.ඩො.මි. 6.6 ක් අයකරගෙන තිබුණි. | කාල දීර්ඝයන් ලබා දීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීමේ දී ගිවිසුම් ප්‍රකාරව කාර්යය නිම නොකිරීමට අදාළව ප්‍රමාද ගාස්තු අය කිරීමේ හැකියාව සම්බන්ධයෙන් දැනුවත් නොකිරීම හේතුවෙන් අයකළ හැකිව තිබූ මුළු ප්‍රමාද ගාස්තුව අයකරගත නොහැකිව තිබුණු බැවින් කාල දීර්ඝයන් නිර්දේශ කළ නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කර අදාළ අලාභ අයකළ යුතුය. |
| (vii) | ප්‍රමාද ගාස්තු ලෙස අය කරගත් ඇමරිකානු ඩොලර් 6,631,364ක මුදලින් අමාත්‍ය මණ්ඩල තීරණ පරිදි ඇමරිකානු ඩොලර් 5,305,091ක් ආපසු ගෙවා තිබුණි. EPC කොන්ත්‍රාත් ගිවිසුමේ ප්‍රතිපාදන අනුව අය කරන ලද ප්‍රමාද ගාස්තු ආපසු ගෙවීම තුළින් දීර්ඝ කළ කාලසීමාවට අදාළ අතිරේක වියදම් සඳහා කොන්ත්‍රාත්කරුට හිමිකම් පෑමට හැකියාව ලැබෙන බව හා ඉන් ඇතිවන බැඳීමේ බලපෑම පිළිබඳව උක්ත අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සඳහා නිර්දේශ ඉදිරිපත් | එසේ වුවද, කොන්ත්‍රාත්කාර FARAB සමාගම විසින් එසේ ප්‍රමාද ගාස්තු අයකිරීමට එකඟ නොවූ නිසා ඔවුන් විසින් කරනු ලැබූ ඉල්ලීම් සලකා බලා අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව එම අයකරගත් මුදලින් සියයට 80 ක් ආපසු ගෙවීමට සිදුවිය. ඉන්පසු මේ දක්වා අමාත්‍ය මණ්ඩලය මඟින් කොන්ත්‍රාත් කාලසීමාව දීර්ඝ කොට ඇති බැවින් ප්‍රමාද ගාස්තු හිමිකම් ඉල්ලීම අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන අවස්ථාවේදී නැවත | කාල දීර්ඝයන් ලබා දීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීමේ දී ගිවිසුම් ප්‍රකාරව කාර්යයන් නිම නොකිරීමට අදාළ ප්‍රමාද ගාස්තු අය කිරීමේ හැකියාව හා එසේ අයකර ගත් ගාස්තුද ආපසු ගෙවීම තුළින් මිල විචලනයන්, පරිපාලන වියදම් වැනි අතිරේක වියදම් සඳහා |

| | | | |
|---|---|---|---|
| | කිරීමේදී අමාත්‍ය මණ්ඩලය දැනුවත් කර නොතිබුණි. | වරක් ඒ සඳහා පවතින බාධාවන් පිළිබඳව දැනුවත් කිරීමේ අවශ්‍යතාවයක් පැන නැඟී නොතිබුණි. | හිමිකම්පෑමට කොන්ත්‍රාත්කරුට ලැබෙන අවස්ථාව සම්බන්ධයෙන් දැනුවත් නොකිරීම හේතුවෙන් ගාස්තු ආපසු ගෙවීමට නිර්දේශ කරන ලද නිලධාරීන්ට එරෙහිව විනයානුකූල ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (viii) | ව්‍යාපෘතියේ ප්‍රධාන උමගෙහි ඇති වූ ජල කාන්දුව සඳහා 2021 අගෝස්තු 31 වන විට ව්‍යාපෘති කාර්යාලය විසින් රු.මිලියන 1,931.34ක් වින්දිත පාර්ශව වෙත ගෙවා තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් මීට අදාළව රක්ෂණ සමාගමෙන් ඇමරිකානු ඩොලර් 8,155,981 ක වන්දියක් ලබාගෙන තිබුණු අතර, කොන්ත්‍රාත්කරු විසින් වින්දිත පාර්ශව වෙත ගෙවිය යුතු වන්දි වෙනුවෙන් රජයෙන් ගෙවූ වන්දි මුදල් කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගත යුතු බවට 2019 මැයි 22 දින රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් නියෝග කර තිබුණද ඉන් රු. මිලියන 1,124.62ක් විගණිත දින වූ 2023 අප්‍රේල් 30 වනවිටත් අය කර ගෙන නොතිබුණි. | 2021.12.21 දින අමාත්‍යාංශ ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් හා සමාජිකයන් 14 දෙනෙකුගේ සහභාගීත්වයෙන් පවත්වන ලද සාකච්ඡාවේදී මේ සම්බන්ධයෙන් නීතිමය උපදෙස් නීතිපති දෙපාර්තමේන්තුවෙන් ලබාගත යුතු බව තීරණය විය. ඒ අනුව අමාත්‍යාංශය නීති නිලධාරි වෙත අවස්ථා දෙකකදී නීතිමය උපදෙස් ලබාගන්නා ලෙස ඉල්ලමින් ලිපි යොමු කොට ඇත. | රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ලබාදී ඇති නියෝග ක්‍රියාත්මක කළ යුතුය. රජයට අය විය යුතු මුදල අයකිරීමට ප්‍රමාද වන කාල සීමාව සඳහා වාණිජ බැංකු පොලී අනුපාතය මත ගණනය කළ පොලියද සමඟ කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනිමට කටයුතු කළ යුතුය. |

## 3.5 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------------------ | --------------------------------------- | --------------- |
| වාරිමාර්ග අමාත්‍යාංශය වැය ශීර්ෂය යටතේ ක්‍රියාත්මක කර තිබුණු මොරගහකන්ද, යාන්ඔය, උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතීන් වලට අදාළ ඉඩම් අත්පත් කර ගැනීමේ, වන්දි මුදල් ප්‍රදානය කිරීමේ හා නැවත පදිංචි කිරීමේ කටයුතු සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කෙරේ. | | |

| | | | |
|---|---|---|---|
| (අ) | **උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය-**<br><br>උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ වන්දි ගෙවීම් සඳහා දරා ඇති වියදම රු. මිලියන 1,491.30 ක් වූ අතර 2015 වසරේ අදාළ කාර්ය නිමකළ යුතු විය. වැලිමඩ, ඌවපරණගම, ඇල්ල, හාලිඇළ, වැල්ලවාය යන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස සඳහා ඉඩම් කට්ටි 1786ක් වන්දි ගෙවීම සඳහා හඳුනාගෙන තිබුණු නමුත් ඉන් ඉඩම් කට්ටි 1586ක් සඳහා පමණක් වන්දි ගෙවා තිබුණි. වන්දි ගෙවීම් කළ ඉඩම් විධිමත්ව පවරා ගෙන ගිණුම් ගත කිරීම් අවසන් කර නොතිබුණි. වන්දි ගෙවීම් ප්‍රමාද වීම හේතුවෙන් රු.මි.163.85ක් පොලී වශයෙන් ගෙවා තිබුණි. | උමා ඔය බහු කාර්ය සංවර්ධන ව්‍යාපෘතිය<br>වන්දි ගෙවීම සඳහා ඉතිරිව ඇති ඉඩම් කට්ටි 200 සඳහා වන්දි ගෙවීම් ප්‍රමාද වීමට හේතු වී ඇත්තේ අධිකරණ කටයුතු, පරීක්ෂණ සඳහා පුද්ගලයින් ඉදිරිපත් නොවීම, නිසි පරිදි ලිපිලේඛන විධිමත්ව ඉදිරිපත් නොකිරීම, විදේශ ගතවීම හා මියයාම ආදී කරුණු මත මෙම ප්‍රමාදයන් සිදුවී ඇති අතරම ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ විධිවිධාන අනුව කටයුතු කිරීමේදී හා විවිධ ආයතන සම්බන්ධීකරණය යටතේ කටයුතු කිරීමේදී යම් කාල ප්‍රමාදයක් සිදු වීමේ ඉඩකඩ පවතී. | ඉතිරි ඉඩම් කට්ටි 200 සඳහා නොපමාව වන්දි ගෙවිය යුතුය. වන්දි ගෙවූ ඉඩම් විධිමත්ව පවරා ගැනීමට හා වාර්තා කිරීමට නොපමාව කටයුතු කළ යුතුය. |
| (ආ) | යාන් ඔය ව්‍යාපෘතිය<br>යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය යටතේ ඉඩම් අත්පත් කර ගැනීම සඳහා රු. මිලියන 4,294 ක වියදමක් දරා තිබුණු අතර මූලික සැලැස්ම අනුව 2019 වසරේ නිම කළයුතු වන්දි ගෙවීම් හා ඉඩම් පවරාගැනීමේ කටයුතු වසර 4 කින් ප්‍රමාද වී තිබුණි. ජලාශය යටතේ පූර්ණ වන්දි ගෙවිය යුතු ඉඩම් කට්ටි 3644 කින් ඉඩම් කට්ටි 311 ක් සඳහා ද, වම් ඉවුර යටතේ පූර්ණ වන්දි ගෙවිය යුතු ඉඩම් කට්ටි 536 ක් සඳහා ද ගෝමරන්කඩවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කුඹුරු ඉඩම් කට්ටි 42 ක් සඳහා ද තවදුරටත් වන්දි ගෙවිය යුතුව තිබුණි. වන්දි ගෙවීම් කළ ඉඩම් විධිමත්ව පවරා ගෙන ගිණුම් ගත කිරීම් අවසන් කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත. | සංවර්ධන ව්‍යාපෘතීන්ට අදාළ ඉඩම් අත්පත් කර ගැනීමේ හා වන්දි ගෙවීමේ කාර්යයන් අප්‍රමාදීව නිම කිරීමට වග බලාගත යුතුය. |
| (ඇ) | **මොරගහකන්ද ව්‍යාපෘතිය** | **මොරගහකන්ද කළු ගඟ කෘෂිකාර්මික සංවර්ධන ව්‍යාපෘතිය** | |
| (i) | මොරගහකන්ද ව්‍යාපෘතිය යටතේ ඉඩම් අත්පත් කරගැනීම සඳහා 2012-2023 කාල සීමාව තුළ රු.මිලියන 9,457.66 ක් ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත නිදහස් කර තිබුණි. විවිධ හේතු මත වන්දි ගෙවීම් අවසන් වී නොතිබුණු අතර ඉඩම් පවරා ගැනීමේ කටයුතුද ඊට සමගාමීව ප්‍රමාද වී තිබුණි. එම එක් එක් ව්‍යාපෘතියේ ඉඩම් කොටස් පවරා ගැනීම, ව්‍යාපෘතියේ කටයුතු සඳහා ඒවා භාවිතා කළ ආකාරය හා අත්පත්කර ගැනීමේ ක්‍රියාවලියේ එක් | ඉඩම් අත්පත් කර ගැනීමේ කාර්යය සිදු කරනු ලබන්නේ අත්පත් කරගත් ප්‍රදේශයට අදාළ ප්‍රාදේශිය ලේකම්වරයාගේ සෘජු මැදිහත්වීමෙන් වන අතර එයට අදාළ සහය හා සම්බන්ධීකරණ පමණක් ව්‍යාපෘතිය මඟින් ලබා දී ඇත.<br>ඒ අනුව අත්පත් කර ගත් ඉඩම්වලට අදාළ නිවැරදි තොරතුරු එම ප්‍රාදේශීය ලේකම් කාර්යාල සතුව | ව්‍යාපෘතීන් සඳහා අත්පත්කර ගත් එක් එක් ඉඩම් කැබලි සඳහා අත්පත්කර ගැනීමේ ක්‍රියාවලිය හා වන්දි ගෙවීම් පිළිබඳ විස්තරාත්මක |

| | | | |
|---|---|---|---|
| | එක් පියවරයන්ට අදාළ තොරතුරු නිශ්චිතව හඳුනාගත හැකි වන පරිදි ලේඛනයක් සකස්කර, යාවත්කාලීන කරන ලද පරිගණකගත තොරතුරු පද්ධතියක් පවත්වා ගෙනගොස් නොතිබුණි. | ඇති අතර අත්පත් පනතේ ඇති විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ පටිපාටිය අනුව නිවැරදි පුද්ගලයින් වෙත හැර වෙනත් පාර්ශ්ව වෙත කුමන හේතුවක් මතවත් වන්දි ගෙවීමට හැකියාවක් නැත.<br>තවද, ව්‍යාපෘතිය සඳහා ඉඩම් කට්ටි 20,000කට ආසන්න ප්‍රමාණයක් අත්පත් කර ගැනීමට කටයුතු කර ඇති අතර එසේ ඉඩම් කට්ටියෙන් කට්ටියට අදාළ වන පරිදි පරිඝණක තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යාමට මෙම කාර්යයේ ස්වභාවය අනුව අසීරු කටයුත්තකි.<br>ව්‍යාපෘතිය මඟින් නඩත්තු කළ දත්ත ලේඛනය විගණනයට ලබා දී ඇත. | තොරතුරු ඇතුළත් කර දත්ත පද්ධතියක් පවත්වාගෙන යා යුතුය.<br>ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත නිදහස් කරනු ලැබූ ප්‍රතිපාදන වලින් ගෙවනු ලැබූ වන්දි පිළිබඳ වාර්තා කැඳවා වන්දි ගෙවීමේ ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යා යුතුය. |
| (ii) | ඉඩම් ආඥා පනතේ 38(අ) හා 44 වගන්ති මඟින් නියමකර ඇති පටිපාටීන් අනුගමනය කර වන්දි ගෙවීම් සිදු කර ඇති ඉඩම් රජය සතු බවට ලියාපදිංචි කර නොතිබුණි. | ඉඩම් අත්පත් පනත අනුව රජයට අත්පත් කර ගත් ඉඩම්වල අයිතිය රජය සතු බවට ලියාපදිංචි කිරීමේ කාර්යය අදාළ ප්‍රාදේශීය ලේකම් හා ඉඩම් අමාත්‍යාංශය සම්බන්ධ වී සිදු කළ යුතු අතර මේ වන විටත් ඒවා රජය සතු බවට ලියාපදිංචි කිරීමට අවශ්‍ය 38(අ) නියෝග ලබා දෙන ලෙසට ඉඩම් අමාත්‍යාංශය වෙත යොමු කර ඇතැත් ඒ සඳහා අවශ්‍ය නියෝග මේ වන තෙක් ලැබී නොමැත. ඒම නියෝග ලැබුණු පසු අත්පත් පනතේ 44 වගන්තිය යටතේ එම ඉඩම් රජය සතු බවට ලියාපදිංචි කිරීම අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් කරනු ඇත. | ඉඩම් ආඥා පනත ප්‍රකාරව ඉටු කළ යුතු කාර්යයන් කඩිනමින් නිම කිරීම සඳහා සැලැස්මක් සකස් කර ඒ අනුව කටයුතු කළ යුතුය. |
| (iii) | මොරගහකන්ද ජලාශයට දේපළ අත්පත් කරගැනීම සම්බන්ධයෙන් ව්‍යාපෘති කාර්යාලයේ ඉඩම් අංශය විසින් 2022 වර්ෂයේ සකස් කර තිබුණු වාර්තා අනුව 2022 වර්ෂය අවසානයට ලග්ගල, නාවුල, මැදිරිගිරිය, කන්තලේ හා ඇළහැර යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 5 තුළ හෙක්ටයාර් 3833.45ක් වූ ඉඩම් කට්ටි 16125ක් පවරා ගැනීම වෙනුවෙන් රු. | පිළිතුරු ලබා දී නැත. | ඉඩම් අංශයේ වාර්තා අනුව හා ගෙවීම් වාර්තා අනුව සංඛ්‍යා සැසඳීම් කර නිවැරදි කිරීම් සිදු කළ යුතුය. ඉඩම් අත්පත් කරගැනීමේ |

| | | | |
|---|---|---|---|
| | මිලියන 9457.66ක් වන්දි වශයෙන් ගෙවා තිබුණි. ව්‍යාපෘතියේ ගෙවීම් වාර්තා අනුව 2022 වර්ෂය අවසානයට ඉඩම් හෙක්ටයාර් 4450.93ක් පවරා ගැනීම වෙනුවෙන් රු. මිලියන 11,196.48ක් වන්දි වශයෙන් ගෙවා තිබුණි. ඒ අනුව තොරතුරු එකිනෙක නොගැළපීම හේතුවෙන් නිරවද්‍ය බවට තහවුරු නොවීය. | | කටයුතු සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත නිදහස් කරනු ලැබූ ප්‍රතිපාදන වලින් එක් එක් ඉඩම් කැබලි සඳහා ගෙවනු ලැබූ වන්දි පිළිබඳ වාර්තා කැඳවා එක් එක් ඉඩම් කැබැල්ල සඳහා ගෙවනු ලැබූ වන්දි මුදල පිළිබඳ විස්තරාත්මක තොරතුරු ඇතුළත් කර දත්ත පද්ධතියක් සකස් කර විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (iv) | ඉඩම් පවරා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කිරීමේදී ව්‍යාපෘතියේ පාරිසරික ඇගයීම් වාර්තා හා ශක්‍යතා අධ්‍යන වාර්තා පදනම් කර නොගැනීමෙන් 2015 ජූලි 20 දිනැති අංක අමප/ 15/1145/604/011 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් නැවත පදිංචි කිරීමේ කටයුතු සඳහා හපුගස්පිටිය, ඕපල්ගල සහ කළු ගඟ ජලාශය යන ප්‍රදේශ වලින් ඉඩම් අක්කර 550ක් පවරා ගැනීමට අනුමැතිය දී තිබුණු නමුත් ඒවා පවරා ගෙන නොතිබුණි. | ඇල්කඩුව,ඕපල්ගම හා හපුගස්පිටිය යන ප්‍රදේශවලින් විකල්ප ඉඩම් ලබාගැනීමට කැමැත්තක් දැක්වූ පවුල් මෙම ප්‍රදේශයේ නොසිටි නිසා එම ඉඩම් ව්‍යාපෘතියට අත්පත් කරගැනීම අර්ථ විරහිත බැවින් එම ඉඩම් ව්‍යාපෘතියේ කටයුතු සඳහා යොදාගෙන නොමැත.<br>කළු ගඟ වසමෙන් ව්‍යාපෘතියට අත්පත් කරගැනීමට රාජකාරී ආරම්භ කරන ලද ඉඩම් අක්කර 50 ව්‍යාපෘතියට අත්පත් කරගැනීමෙන් හා එම ඉඩම් වල හිමිකරුවන් වෙත ප්‍රතිලාභ ලබාදීමෙන් අනතුරුව ව්‍යාපෘති කටයුතු වලට යොදාගැනීමට ඉඩම් ඉතිරි නොවන නිසා ඒවා අත්පත් කරගැනීමෙන් රජයට සිදුවන පාඩුව සලකා අත්පත් කර ගැනීමට කටයුතු කර නොමැත. | ඉඩම් පවරා ගැනීම් හා සම්බන්ධ අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීමේ දී ව්‍යාපෘතියට අදාළ පාරිසරික ඇගයීම් වාර්තා හා ශක්‍යතා අධ්‍යන වාර්තාවන් පදනම් කරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (v) | මොරගහකන්ද කෘෂිකාර්මික සංවර්ධන ව්‍යාපෘතියෙහි නැවත පදිංචි කිරීමේ සැලැස්මේ 5.1.5 ඡේදය අනුව මොරගහකන්ද ව්‍යාපෘතිය හේතුවෙන් අවතැන් වූ පවුල් 302 ක් මැදිරිගිරිය D කලාපයේ පදිංචි කිරීමට යෝජනා කර එම කලාපය තුළ නබඩවැව, දහම්වැව හා බණ්ඩාරවැව ලෙස නව ගම්මාන 3 ක් හා බිසෝපුර ලෙස ප්‍රාදේශීය මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීමටත් එම ගම්මාන තුළ ඉඩම් හෙක්ටයාර් 2,072 ක් ගොවි බිම් කට්ටි 2,680 ක් ලෙස හා ඉඩම් හෙක්ටයාර් 914 ක් ගෙවතු ඉඩම් කට්ටි 3,350 ක් ලෙස සංවර්ධනය කර අදාළ පවුල් වෙත බෙදාදීමටත් හඳුනා ගෙන තිබුණි. එහිදී මොරගහකන්ද කළුගඟ ජලාශ ව්‍යාපෘතියේ පහළ නිම්න සංවර්ධන කාර්යයන් යටතේ 2009 සිට 2022 වර්ෂය දක්වා රු.මිලියන 4,446.26 ක් වැය කර තිබුණි.<br>එයින් ඉඩම් කට්ටි 7ක් පමණක් මොරගහකන්ද කළුගඟ ජලාශ ඉදිකිරීමේදී අවතැන් වූ පවුල් වෙත බෙදා දී තිබුණු අතර ඉතිරි පවුල් සඳහා වන්දි ගෙවීම සිදුකර තිබුණි. වෙන් කර තිබූ ඉතිරි ඉඩම් කට්ටි වලින් කොටසක් ඉඩම් කච්චේරි පවත්වා මැදිරිගිරිය හා ලංකාපුර යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි පදිංචිකරුවන් වෙත බෙදා දී තිබුණු අතර කොටසක් තව දුරටත් බෙදා දිය යුතුව පැවතුණි. ඒ අනුව ව්‍යාපෘතියේ මූලික සැලසුම් අනුව නැවත පදිංචි කිරීම සඳහා හඳුනාගෙන ස්ථාපිත ගම්මාන, මඩ කුඹුරු ඉඩම් හා එම ගම්මානයන්හි ඉදිකර තිබුණු සෞඛ්‍ය මධ්‍යස්ථාන, සමූපකාර, පොදු වෙළඳපොළ, සමෘද්ධි බැංකු, බස් නැවතුම්පොළ හා අනෙකුත් පොදු පහසුකම් ගොඩනැගිලි ඌන උපයෝජිතව පැවතියදී ඉඩම් ව්‍යාපෘතියෙන් පරිබාහිරව අවධිමත්ව තෝරාගත් පිරිස් වෙත බෙදා දී තිබුණි. | පිළිතුරු ලබා දී නැත. | නැවත පදිංචිකිරීම් සඳහා ප්‍රදේශ හඳුනා ගැනීමේදී නිසි පරිදි ශක්‍යතා අධ්‍යන සිදු කළ යුතුය. ව්‍යාපෘතියේ මූලික සැලසුම් වලට පරිබාහිරව සිදු කළ නැවත පදිංචි කිරීම් හේතුවෙන් රාජ්‍ය සම්පත් අවභාවිතා වීම හා ඌන උපයෝජනය සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් හඳුනා ගෙන විනයානුකූලව කටයුතු කළ යුතුය.<br>ඌන උපයෝජිත ගොඩනැගිලි සැලසුම් සහගතව ව්‍යාපෘතිය වෙනුවෙන් භාවිතා කළ යුතුය. |
| (vi) | අවතැන් වූ පාර්ශවයන් වෙත ජීවනෝපාය ආධාර සැලසීම ඇතුළු නැවත පදිංචි කිරීමේ කටයුතු හා ඉදි කිරීම් සඳහා ඉඩම් පවරා ගැනීමට 2008 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා රු. මිලියන 13,700 ක් වැය කර තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2017 | පිළිතුරු ලබා දී නැත. | ඉඩම් පවරා ගැනීම, වන්දි මුදල් ප්‍රදානය කිරීම සහ නැවත පදිංචි කිරීම යන කටයුතු |

| | | |
|---|---|---|
| වර්ෂය් දී නිම කිරීමට නියමිතව පැවති නමුත් වර්ෂ 5ක් ප්‍රමාද වී තිබුණු හෙයින් ඉඩම් පවරා ගැනීම හා නැවත පදිංචි කිරීම ප්‍රමාද වී තිබුණි. | | කඩිනමින් අවසන් කිරීමට සැලසුම් කර ඒ අනුව කටයුතු කළ යුතුය. |

## 3.6 විදේශ ආධාර ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------- | ------------------------------------ | --------------- |
| (අ) **ගිං නිල්වලා හැරවුම් ව්‍යාපෘතිය**<br><br>ගිං නිල්වලා හැරවුම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2014 නොවැම්බර් 05 දින වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය සහ චීනයේ CAMEC සමාගම ඇ.ඩො.690,000,000ක EPC කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබූ අතර ඒ සඳහා වැඩ පූර්ව අත්තිකාරම් ලෙස කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 4.35ක් වූ ඇ.ඩො. 29,989,000 ක් (රු.4,011,054,982) ගෙවා තිබුණි. 2015 මැයි මස 26 දින පැවති ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකමිටුවේ තීරණයක් අනුව ව්‍යාපෘතිය තාවකාලිකව නතර කර තිබුණි. අනතුරුව ආර්ථික කළමනාකරණය පිළිබඳ අනුකමිටුව විසින් මෙම ව්‍යාපෘතිය නිල්වලා ගඟ ආශ්‍රිතව පමණක් සිදු කිරීමට නිර්දේශ කර තිබුණු අතර ඒ අනුව අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබා දී තිබුණි. එයට අදාළව පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීමෙන් තොරව ගිං ගඟ හා නිල්වලා ගඟ යන කොටස් 2 ම පිළිබඳ අධ්‍යනය කිරීමට 2017 ජූලි 20 දින ගිවිසුමකට එළඹ කොන්ත්‍රාත්කරුවෙකු වෙත පවරා තිබුණි. | ගිං නිල්වලා හැරවුම් ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ ගිං හා නිල්වලා යන ගංගා ද්‍රෝණි ද්විත්වයෙහි පවත්නා අතිරික්ත ජලය අග්නි දිග වියළි කලාපය වෙත හරවා යැවීම වන අතර එහිදී වැඩි ජල ප්‍රමාණයක් එනම් වාර්ෂිකව හරවා යැවීමට අපේක්ෂිත ඝන මීටර් මිලියන 300 ක ප්‍රමාණයෙන් ඝන මීටර් මිලියන 200 ක් ගෙන යා හැකි වන්නේ ගිං ගඟ ද්‍රෝණියෙනි. නිල්වලා ද්‍රෝණියේ පවත්නා භූ විද්‍යා ,ජල | ව්‍යාපෘතියේ මූලික අදියරයේදී ඉටු කළ යුතු අනුමත කිරීමේ කාර්යය නිම කිරීමෙන් තොරව කොන්ත්‍රාත් ගිවිසුම් එළඹීමට කටයුතු නොකළ යුතු වුවත් ඒ අනුව කටයුතු නොකර ගිවිසුම්වලට එළඹීම සම්බන්ධයෙන් |

| | | | |
|---|---|---|---|
| | | විද්‍යා හා භූගෝලීය සාධක මත මෙසේ හරවා යැවිය හැකි ජල ප්‍රමාණය සීමා වී ඇත. එබැවින් නිල්වලා ගංගා ද්‍රෝණියේ ජලය පමණක් හරවා යැවීම කිසිසේත් ප්‍රමාණවත් නොවන අතර ඒ සඳහා සැලකිය යුතු පිරිවැයක් දැරිය යුතු වන බැවින් නිල්වලා ගඟ ආශ්‍රිතව පමණක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් එය තාක්ෂණික හා ආර්ථිකමය වශයෙන් ශක්‍යතාවය ඉතා අඩු ව්‍යාපෘතියක් වනු ඇත. එම හේතුව මත ගිං හා නිල්වලා යන ගංගා ද්‍රෝණි ද්විත්වයම ආශ්‍රිතව අධ්‍යයන කටයුතු කිරීමට අදාළ සමාගමට පවරා ඇත. | වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ XLVIII වන පරිච්ඡේදයේ 29 වගන්තිය යටතේ විනයානුකූලව ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ii) | ගිවිසුම්ගත කොන්දේසි අනුව 2016 නොවැම්බර් 09 දින සිට මාස 8 කින්, එනම් 2017 ජූලි 09 ව්‍යාපෘතියේ පළමු අදියර නිම කිරීමට අපේක්ෂා කර තිබුණද 2023 මාර්තු දක්වා වසර 5කට වැඩි කාලයක් සඳහා කාලය දීර්ඝ කර තිබුණි. එසේ වුවද දීර්ඝ කළ කාලය අවසානයේ මූලික සැලසුම් කිරීමේ කාර්යයෙන් සියයට 92.5ක් පමණක් නිම කර තිබුණි. ඒ අනුව අවුරුදු 5කුත් මාස 4 ක් ප්‍රමාද වූ පසුවද පළමු අදියර වූ ව්‍යාපෘතියේ සැලසුම් සකස් කිරීමේ කටයුතු වලින් සියයට 7.5ක ප්‍රමාණයක් තව දුරටත් නිම කළ යුතුව පැවතුණි | ගිං නිල්වලා හැරවුම් ව්‍යාපෘතියේ අදියර 1, එනම් සවිස්තරාත්මක මිනුම් කටයුතු හා භූ විද්‍යා හා ජල විද්‍යා අධ්‍යාන, ගැඹුරු භූ විදුම් හා භූ තාක්ෂණ අධ්‍යාන සිදුකර ශක්‍යතා අධ්‍යානය යාවත්කාලීන කිරීම හා මූලික සැලසුම් නිම කිරීම, ගිවිසුම් කොන්දේසි අනුව 2017 අගෝස්තු 09 වන දින වන විට අවසන් කිරීමට නියමිත වුවද ඒ සඳහා පැවැති දැඩි බාධක හමුවේ මේ වන තෙක් නිම කර ගැනීමට නොහැකිව ඇත. | ව්‍යාපෘතිය අනුමත කිරීමේ මූලික අදියරයන්හි ඉටු කළ යුතු කාර්යයන් නිම නොකර කොන්ත්‍රාත් ගිවිසුම්වලට නොඑළඹිය යුතුය. ඊට වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව විනයානුකූලව ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (iii) | වර්ෂ 5 ක් තුළ ව්‍යාපෘති කාර්ය මණ්ඩලයේ වැටුප්, දීමනා හා අනෙකුත් ව්‍යාපෘති කටයුතු වෙනුවෙන් රු. මිලියන 27 ක් වැයකර තිබුණු අතර ව්‍යාපෘතියේ කටයුතු වසර 7 ක් අඛණ්ඩව ප්‍රමාද වීම තුළ එය අනාර්ථික හා අතිරේක වැය බරක් බවට පත්ව තිබුණි. | ව්‍යාපෘතියේ අනුමත කාර්ය මණ්ඩලය 15 ක් වුවද කිසිඳු අවස්ථාවක සම්පූර්ණ කාර්ය මණ්ඩලය බඳවා ගෙන නැත. හැකි සෑම අවස්ථාවකදීම අවම කාර්ය මණ්ඩලයක් හරහා ව්‍යාපෘති කටයුතු සිදුකරගෙන ගොස් ඇති අතර එමඟින් 2017 සිට මේ දක්වා කාර්ය මණ්ඩල වෙනුවෙන් ගෙවන ලද වැටුප් රු.මි.27කට පමණ සීමා කර ගැනීමට හැකිවී ඇත. තවද 2017 සිට මේ දක්වා ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුර වෙනුවෙන් කිසිදු වැටුපක් ගෙවා නොමැත. | ව්‍යාපෘති සඳහා බඳවා ගෙන ඇති කාර්ය මණ්ඩලයේ කොන්ත්‍රාත් ගිවිසුම් දීර්ඝ කිරීමට පෙර කාර්යසාධනය තහවුරු කර ගත යුතුයි. පරිපාලන වියදම් හැකි පමණ අවම කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (iv) | ව්‍යාපෘතියේ සැලසුම් සඳහා වූ සම්පූර්ණ | මෙවැනි තාක්ෂණික මෙන්ම | රාජ්‍ය අරමුදල් |

| | | | |
|---|---|---|---|
| | පිරිවැයම 2014 වර්ෂයේ ගෙවා තිබියදී සැලසුම් කිරීම නිම කර නොතිබීම මත ඊට අදාළව දරා තිබූ රු.4,079,516,982ක පිරිවැය තුළින් (2014 හා 2015 වර්ෂ වල ගෙවූ ඇ.ඩො.29,989,000ක අත්තිකාරම්ද ඇතුළුව) වසර 9 තුළ කිසිදු ආර්ථික ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි. | සමාජීය හා පාරිසරික වශයෙන් සංකීර්ණ ව්‍යාපෘතියක අධ්‍යයන හා සැලසුම් අදියරේදී මේ දක්වා සිදුකර ඇති අධ්‍යයනයන් හා පරීක්ෂණ තුළින් එළඹ ඇති නිගමනයන් ප්‍රයෝජනයක් නොමැති කරුණු ලෙස නිරීක්ෂණය නොකරමි. මෙවැනි ව්‍යාපෘතියක අධ්‍යයන සැලසුම් වෙනුවෙන් දරන්නාවූ වැය බර ව්‍යාපෘතිය ක්‍රියාත්මක වූ පසුව හිමි වන ප්‍රතිලාභ පිළිබඳ සලකා බලා සංසන්දනය කිරීම වඩාත් සුදුසු බවට නිරීක්ෂණය කරමි.<br>මෙම අවස්ථාවේදී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වුවද ව්‍යාපෘති අධ්‍යාන කටයුතු වෙනුවෙන් දරන්නා වූ වියදම ඉදිරියේදී ඇති විය හැකි කාලගුණික දේශගුණික විපර්යාස හමුවේ හා මානව අවශ්‍යතා හමුවේ වඩාත් ප්‍රයෝජනවත් වනු ඇත. | අවභාවිතය පිළිබඳ පූර්ණ පරීක්ෂණයක් සිදු කර වගකිව යුතු සියලු පාර්ශවයන්ට එරෙහිව නිතීය මගින් දිය හැකි උපරිම දඬුවම් ලබා දිය යුතුය. |
| (ආ) | **මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන**<br>ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර යටතේ ක්‍රියාත්මක කර තිබුණු උක්ත ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ. | | |
| (i) | **ව්‍යාපෘතියේ අදියර 1**<br>මේ යටතේ කළුගඟ ජලාශයේ සිට මොරගහකන්ද ජලාශයට ජලය ගෙන යාම සඳහා කි.මී. 8.8ක් දිගැති උමං මාර්ගය කැණීමේ කොන්ත්‍රාත්තුව, 2018 – 2021 කාලය තුළ නිම කිරීම සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 21.79ක් (රු.මිලියන3,349.74) සහ ශ්‍රී ලංකා රු. මිලියන 3,797.17ක් වශයෙන් මුළු වටිනාකම රු. මිලියන 7,146.91කට විදේශ සමාගමකට භාර දී තිබුණි. කොන්ත්‍රාත්තුව අදාළ කාලය තුළ නිම නොකිරීම හේතුවෙන් 2022 ජුනි 30 දක්වා දීර්ඝ කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විට වැඩසටහනේ උපදේශන සමාගම (Tractebel) 2022 දෙසැම්බර් 31 දිනට නිකුත් කළ ප්‍රගති වාර්තාවට අනුව විදුම් කටයුතු සම්පූර්ණයෙන් අවසන් කර | ඉදිරිපත් කළ කරුණ හා එකඟ වෙමි.<br>මෙම කොන්ත්‍රාත්තුවේ ඉදිකිරීම් පිරිවැය ඉදිරියේදී බදු රහිතව රුපියල් මිලියන 8,251 හා බදු සහිතව රුපියල් මිලියන 9,383 ක් ලෙස ගණනය කර ඇති බව සඳහන් කරනු කැමැත්තෙමි. | ව්‍යාපෘතිය නොපමාව නිම කළ යුතුය.<br>මිල විචලනයන් පිළිබඳ අවධානය යොමු නොකර කාලය දීර්ඝ කිරීම පිළිබඳ පරීක්ෂණයක් සිදු කර වරදක් සිදු වී ඇති බව තහවුරු වේනම් විනය පියවර ගත යුතුය. |

මුළු ප්‍රගතිය සියයට 82ක් ලෙස දක්වා තිබුණු අතර 2022 වර්ෂයේ ඉදිකිරීම් ප්‍රගතිය සියයට 12ක් විය. කොන්ත්‍රාත්තුවේ මිල විචලනයන් සඳහා රු. මිලියන 274.5ක් වෙන් කර තිබුණත් සමාලෝචිත වර්ෂය අවසානය වනවිට රු. මිලියන 781.48ක් ඒ සඳහා ගෙවා තිබුණි. මෙම කොන්ත්‍රාත්තුවේ ඉදිකිරීම් පිරිවැය ඉදිරියේදී ඇමරිකානු ඩොලර් මිලියන 35 (ආසන්න වශයෙන් රු. මිලියන 9,383) දක්වා ඉහළ යා හැකි බවට ඇස්තමේන්තු කර තිබුණි.

**(ii) ව්‍යාපෘතියේ අදියර 2 - උතුරු මැද මහා ඇළ ව්‍යාපෘතිය**

**1.** අදියර 2 යටතේ උතුරු මැද මහ ඇළ ව්‍යාපෘතියෙහි මොරගහකන්ද ජලාශයේ සිට ජලය ගෙන යාමට කි.මී. 27.7ක් උමං මාර්ගයක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2020 – 2027 කාලය තුළ නිම කිරීම සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 106.09 ක් (රු.මිලියන 18,893.17) සහ ශ්‍රී ලංකා රු. මිලියන 21,179.97ක් වශයෙන් මුළු වටිනාකම රු. මිලියන 40,073.14 කට විදේශ සමාගමකට භාර දී තිබුණි. අදාළ ණය ගිවිසුම 2018 මැයි 18 දින අත්සන් කර තිබුණද කොන්ත්‍රාත්තුව ලබා දීමට වසර 02 ½ ක කාලයක් ප්‍රමාද වී තිබුණි.

2. කොන්ත්‍රාත්තුවේ වැඩ නිම කළ යුතු දිනය 2027 මාර්තු 10 දින ලෙස සංශෝධනය කර තිබුණද කොන්ත්‍රාත්තුව 2025 ජුනි 07 දිනට කඩිනමින් නිම කිරීම සඳහා, භාවිත කරනු ලැබූ උමං විදුම් යන්ත්‍රයට අතිරේකව 02 වන උමං විදුම් යන්ත්‍රයක් මිලදී ගැනීමට 2021 ඔක්තෝබර් 07 වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. ඒ අනුව ඇමරිකානු ඩොලර් මිලියන 143.87 ක්ද, ශ්‍රී ලංකා රු. මිලියන 20,541.94 ක්ද ඇතුළුව රු. මිලියන 46,164.31 ක මුළු වටිනාකමට මුල් කොන්ත්‍රාත්තුව සංශෝධනය කර තිබුණි. එමගින් රු. මිලියන 6,690.97 කට දෙවන උමං විදුම් යන්ත්‍රයක් මිලදීගෙන 2022 ඔක්තෝබර් මාසයේ

ඉදිරිපත් කළ කරුණු හා එකඟ වෙමි.

කොන්ත්‍රාත්තුවට අදාළ 2023.04.30 දිනට භෞතික ප්‍රගතිය 12% කි. මේ වන විට උමඟේ මීටර් 780 ක් නිමා කර ඇත.

ව්‍යාපෘතිය කඩිනම් කිරීම සඳහා දෙවන උමං විදුම් යන්ත්‍රයක් මිලදී ගැනීමට අමාත්‍ය මණ්ඩලය වෙත යෝජනා කිරීමේදී සාර්ව ආර්ථික විචල්‍යයන් පිළිබඳ ප්‍රමාණවත් විශ්ලේෂණයන් සිදු නොකිරීම හේතුවෙන් රජයට සිදු වී ඇති පාඩුව පිළිබඳ විධිමත් පරීක්ෂණයක් සිදු කර ඒ අනුව වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ගවලට එළඹිය යුතුය.

මෙරටට ආනයනය කර තිබුණි.

3. අනතුරුව රටේ පවතින ආර්ථික අවපාතය හා අමතර අරමුදල් කඩිනම්ව සොයාගැනීමට ඇති අපහසුව නිසා දැනට පවතින ඇමරිකානු ඩොලර් මිලියන 69.5ක (රු. මිලියන 22,240 පමණ) ප්‍රතිපාදනය තුළ එක් උමං විදුම් යන්ත්‍රයක් පමණක් පාවිච්චි කරමින් කොන්ත්‍රාත්තුව 2024 ජූනි දක්වා පවත්වා ගෙන යාමටත් අලුතින් ආනයනය කළ උමං විදුම් යන්ත්‍රය 2024 මාර්තු දක්වා ක්‍රියාත්මක නොකිරීමටත් 2023 අප්‍රේල් 03 දින අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණි. සමස්ත ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය පසුගාමී තත්ත්වයක පවතින බව හා ඉදිරි ක්‍රියාකාරීත්වයද අවිනිශ්චිත අදියරක පවතින නිසා කොන්ත්‍රාත් පැකේජ 21කින් සමන්විත මෙම ව්‍යාපෘතිය සම්බන්ධව සුදුසු විකල්ප ක්‍රමවේදයන් සකස් කිරීමට ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවට පවරා ඇති බවත්, එම දෙපාර්තමේන්තුව මඟින් යෝජනා කරන විකල්ප ක්‍රමවේදය ජාතික මෙහෙයුම් මැදිරියට ඉදිරිපත් කිරීමට නිර්දේශ කරන බවත් සඳහන් මෙම නිර්දේශය ක්‍රියාත්මක කිරීමට 2023 අප්‍රේල් 03 පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී තිබුණි.

4. කොන්ත්‍රාත්තුව ආරම්භ කර වසර 02ක් ගතවී ඇති සමාලෝචිත වර්ෂය අවසානයට උපදේශන සමාගම (Tractebel) නිකුත් කළ 2022 ප්‍රගති වාර්තාවට අනුව ඉදිකිරීම් ප්‍රගතිය සියයට 10ක අඩු මට්ටමක පැවතුණු අතර, උමං මාර්ගයේ මීටර් 50ක දුර ප්‍රමාණයක් පමණක් නිමකර තිබුණි. මෙම කොන්ත්‍රාත්තුවේ ඉදිකිරීම් පිරිවැය ඉදිරියේදී ඇමරිකානු ඩොලර් මිලියන 240.30 (රු. මිලියන 86,508) දක්වා ඉහළ යා හැකි බවට ඇස්තමේන්තු කර තිබුණි.

| | | |
|---|---|---|
| (iii) **ව්‍යාපෘතියේ අදියර 2 - වයඹ මහ ඇළ ව්‍යාපෘතිය** | | |
| 1. වයඹ මහ ඇළ ව්‍යාපෘතිය යටතේ මහකිතුළ, මහකිරුළ ජලාශ 02 හා ඒ අතර අතු ඇළ සහ උමං මාර්ග ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2020 -2024 කාලය තුළ නිම කිරීමට ඇමරිකානු ඩොලර් මිලියන 30.21ක් (රු.මිලියන 5,386.64) සහ ශ්‍රී ලංකා රු. මිලියන 4,591.84ක් ඇතුළු මුළු වටිනාකම රු. මිලියන 9,978.48කට චීනයේ CAMEE-QMCG-JV විදේශ සමාගමකට 2020 වර්ෂයේදී භාර දී තිබුණි. එසේ වුවද, කොන්ත්‍රාත් සමාගමේ කාර්ය මණ්ඩල හිඟය, ඉදිකිරීම් උපකරණ නොමැති වීම හා දුර්වල වැඩබිම් කළමනාකරණය හේතුවෙන් වසර 02ක කාලයක් තුළ ඉදිකිරීම් ප්‍රගතිය උපදේශන සමාගම (Tractebel) නිකුත් කළ 2022 ප්‍රගති වාර්තාවට අනුව සියයට 2.97ක තරම් පහළ මට්ටමක පැවතුණි. | ඉදිරිපත් කළ කරුණු හා එකඟ වෙමි. ප්‍රමාණවත් ප්‍රගතියක් අත්කර ගැනීමට නොහැකි වීම මත කොන්ත්‍රාත්තුව අත්හිටුවීමට කටයුතු කරන ලදී. අත්හිටුවීම කොන්ත්‍රාත්කරු විසින්ද පිළිගෙන ඇති අතර අත්තිකාරම් සුරැකුමට අදාළ මුදල ආපසු ගෙවීමට කොන්ත්‍රාත්කරු එකඟ වී ඇත. ඒ අනුව අත්තිකාරම් ලෙස ගෙවන ලද රු.389,321,808 ක මුදල හා ඇමරිකානු ඩොලර් 4,531,291.55 ක වටිනාකම අයකර ගැනීමට කටයුතු කර ඇත. | ගිවිසුම්ගත කාලය තුළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ඉදිරිපත් කර ඇති සැලැස්මට අනුකූලව කටයුතු නොකිරීම සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු දැනුවත් කර ප්‍රමාද දඩ අය කිරීමට කටයුතු කළ යුතුය. |
| 2. මේ හේතුවෙන් කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමට ව්‍යාපෘතිය විසින් පියවර ගනිමින් පැවතුණද කොන්ත්‍රාත්කරු වෙත වැඩ පූර්ව අත්තිකාරම් ලෙස රු.මිලියන 1,197.32ක් හා නිම කළ වැඩ වෙනුවෙන් රු. මිලියන 355.24ක් ගෙවා තිබුණි. ඉදිරියේදී මෙම කොන්ත්‍රාත්තුවේ ඉදිකිරීම් පිරිවැය ඇමරිකානු ඩොලර් මිලියන 48.9 (ආසන්න වශයෙන් රු. මිලියන17,604) දක්වා ඉහළ යා හැකි බවට 2021 වර්ෂයේ ඇස්තමේන්තු කර තිබුණි. | | |
| (iv) **අදියර 2 - කෘෂිකාර්මික භාණ්ඩ මිලදී ගැනීම** | | |
| අදියර 2 යටතේ ප්‍රධාන ඉදිකිරීම් කොන්ත්‍රාත් 02 ක් සඳහා වෙන්කර තිබුණු ඇමරිකානු ඩොලර් මිලියන 140.47 කින් ඇමරිකානු ඩොලර් මිලියන 39 ක් සහ තවත් කාර්යයන් කිහිපයක් සඳහා වෙන් කළ මුදලින් ඇමරිකානු ඩොලර් මිලියන 11ක් වශයෙන් එකතුව ඇමරිකානු ඩොලර් මිලියන 50 ක් කෘෂිකාර්මික භාණ්ඩ | රසායනික පොහොර ප්‍රසම්පාදනය සඳහා පමණක් අනුමැතිය ලබා දෙමින් අමප/22/1517/623/016/ටීබීආර් හා 2022 ඔක්තෝබර් 03 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අනුව ආනයනය කරන ලද MOP රසායනික පොහොර මෙට්‍රික් ටොන් 41,876ක තොගය 2022 දෙසැම්බර් | වාර්තා වී ඇති ඌනතාවය පිළිබඳ විධිමත් පරීක්ෂණයක් අමාත්‍යාංශය මඟින් සිදු කර වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| මිලදී ගැනීම සඳහා වෙන් කිරීමට ආසියානු සංවර්ධන බැංකුව අනුමැතිය ලබා දී තිබුණි. එයින් ඇමරිකානු ඩොලර් මිලියන 39.78ක් (රු. මිලියන 14,202) වැයකර 2022/2023 මහ කන්නයේ වී වගාව සඳහා MOP රසායනික පොහොර මෙට්‍රික් ටොන් 41,876ක් ආනයනය කර පොහොර තොගය 2022 දෙසැම්බර් 05 දින කෘෂිකර්ම අමාත්‍යාංශයට භාර දී තිබුණි. මෙම පොහොර කිලෝ ග්‍රෑම් 50 මලුවලට අසුරා කෘෂිකර්ම අමාත්‍යාංශය වෙනුවෙන් රජයට අයත් පොහොර සමාගම් 02 කට භාර දී තිබුණු අතර වරායේ දී සිදු කළ එම භාර දීමේදී වටිනාකම රු. මිලියන 55.233ක් වූ පොහොර මලු 3,230 ක ඌනතාවයක් ඇති වී තිබුණි. | 05 දින වරායේදී කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් වෙත භාර දෙන ලදී. පොහොර බෙදාහැරීම පිළිබඳ කටයුතු සිදුකරන ලද්දේ කෘෂිකර්ම අමාත්‍යාංශය මඟිනි. | |
| (v) **ව්‍යාපෘතියේ අදියර 3** | | |
| 1. ව්‍යාපෘතියේ 3 වන අදියර යටතේ උතුරු මැද මහ ඇළ ව්‍යාපෘතිය, වයඹ පළාත් මහ ඇළ ව්‍යාපෘතිය සහ මිණිපේ වම් ඉවුරු ඇළ පුනරුත්ථාපන යන ව්‍යාපෘතීන් සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 93ක් ආසියානු සංවර්ධන බැංකුව මඟින්ද, ඇමරිකානු ඩොලර් මිලියන 36ක් ශ්‍රී ලංකා රජය මගින්ද, ඇමරිකානු ඩොලර් මිලියන 114ක් වෙනත් විදේශීය මූලාශ්‍ර මඟින්ද ලබා ගැනීමට නියමිතව තිබුණත්, රට තුළ පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් මෙම ප්‍රතිපාදන සපයාගත නොහැකිව තිබුණි. ඇමරිකානු ඩොලර් මිලියන 675 කට ඇස්තමේන්තු කර තිබූ මුළු ව්‍යාපෘතියේ වටිනාකම ඇමරිකානු ඩොලර් මිලියන 976 දක්වා ඉහළ යාහැකි බවට 2021 වර්ෂයේ ඇස්තමේන්තු කර තිබුණි. | ඉදිරිපත් කර ඇති සියලු කරුණු හා එකඟ වෙමි. | අරමුදල් මූලාශ්‍ර සම්බන්ධ නිශ්චිත කර ගැනීමකින් තොරව ව්‍යාපෘතිය ආරම්භ නොකළ යුතුය. |
| 2. අදියර 3 යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණු කොන්ත්‍රාත් පැකේජ 09ක් අතරින්, කොන්ත්‍රාත් පැකේජ 06ක් සඳහා අදියර 2 යටතේ ලැබුණු ප්‍රතිපාදන වලින් රු. 1,708,486ක් වැයකර කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගෙන තිබුණද අදියර 3 සඳහා අවශ්‍ය මූල්‍ය | 2024.12.31 වන විට කටයුතු නිමා කිරීමේ පදනම මත අදාළ කොන්ත්‍රාත්කරු තෝරා ගැනීමට කටයුතු කර තිබූ අතර රට තුළ ඇතිවූ ආර්ථික පසුබිම මත අදියර 3 සඳහා ණය ලබා දීම ආසියානු සංවර්ධන බැංකුව කල් දැමීම මත කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට | අරමුදල් මූලාශ්‍ර සම්බන්ධ නිශ්චිත කර ගැනීමකින් තොරව ව්‍යාපෘති කටයුතු ආරම්භ නොකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රතිපාදන නොලැබීම මත කොන්ත්‍රාත් ක්‍රියාත්මක කර නොතිබීමෙන් ප්‍රසම්පාදන කටයුතු සඳහා දරන ලද රු. 1,708,486ක වියදම නිෂ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි. | නොහැකි විය. | |
| (ඇ) | **දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය**<br>දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතියේ (CRIP) ප්‍රතිපාදන යටතේ 2021 වර්ෂය දක්වා රු. මිලියන 430 ක් වැය කර ශක්‍යතා අධ්‍යනයන් 6 ක් සිදු කර තිබුණද ඒ යටතේ ඉදිරිපත් කර තිබූ වාර්තා අනුව අමාත්‍යාංශය විසින් ව්‍යාපෘතීන් සැලසුම් කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත. | ශක්‍යතා අධ්‍යනයන් සිදුකර ඇති ව්‍යාපෘතීන් ප්‍රමුඛතාවය අනුව සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඇ) | **වැව්ගම් පුබුදුව ව්‍යාපෘතිය/දේශගුණික විපර්යාසයන්ට අනුහුරුවීම සඳහා වූ ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතිය** | | |
| (i) | ව්‍යාපෘතිය සඳහා හරිත දේශගුණික අරමුදල (GCF) පසුගිය වසර 06 තුළ රු. මිලියන 6650.66කට සමාන එ.ජ.ඩො. මිලියන 30.01 ක් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) වෙත ලබා දී තිබුණද, 2022 දෙසැම්බර් 31 වන විට රු. මිලියන 1,465.15 කට සමාන එ.ජ.ඩො. මිලියන 7.99 ක් පමණක් මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය (MMDE) වෙත ලබා දී තිබුණි. ලබා දී තිබුණු සම්පූර්ණ මුදලින් සියයට 22 ක් නියෝජනය වන උක්ත මුදල සඳහා පමණක් ව්‍යාපෘතිය විසින් මූල්‍ය ප්‍රකාශන සකස් කර තිබුණු අතර ඒ හේතුවෙන් සමස්ත ව්‍යාපෘතියේ මූල්‍ය කාර්යසාධනය සහ මූල්‍ය තත්ත්වය එමඟින් හෙළිදරව් කර නොතිබුණි. | වැව් ගම් පුබුදුව ව්‍යාපෘතිය<br>• මෙම ව්‍යාපෘතිය සඳහා වාර්ෂික අනුමත අයවැය ඇස්තමේන්තුව (VOTE No 13 & 17) මගින් ප්‍රතිපාදන වෙන්කරනු ලබයි. ඒ අනුව ව්‍යාපෘතිය විසින් කරනු ලබන වියදම් මහා භාණ්ඩාගාරය වෙත වාර්තා කරමින් අදාළ ප්‍රතිපාදන යටතේ අක්මුදල් ලබා ගැනීම සිදු කරනු ලබයි.<br>• ඒ අනුව ව්‍යාපෘතියේ වාර්ෂික අවසාන ගිණුම් එම ප්‍රතිපාදන වලින් ලැබූ මුදල් වලට සාපේක්ෂව කරනු ලබන වියදම පමණක් ඉදිරිපත් කරන ලදි. හරිත දේශගුණික අරමුදල් වෙතින් ව්‍යාපෘතිය වෙත මුදල් ලබා දෙන්නේ එහි නියෝජිත වූ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන හරහාය. | ව්‍යාපෘතියේ සමස්ත මූල්‍ය කාර්යසාධනය සහ මූල්‍ය තත්ත්වය පිළිබිඹු වන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |
| (ii) | ඉතිරි රු.මිලියන 5185.51කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 22.01ක මුදලින් ව්‍යාපෘතියේ කටයුතු කිහිපයක් සිදුකිරීම සඳහා UNDP විසින් රු.මිලියන 2776.61කට සමාන එ.ජ.ඩො.මිලියන 13.94ක් වැය කර තිබුණි. ඒ අනුව එ.ජ.ඩොලර් මිලියන 8.07කට සමාන රු. මිලියන 2,408.9ක වියදම් සම්බන්ධ තොරතුරු හෙළිදරව් කර නොතිබුණි. | • අමාත්‍යාංශය හා එම ආයතනය අතර ඇතිකරගෙන ඇති ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ගිවිසුම මත හරිත දේශගුණික අරමුදල විසින් ව්‍යාපෘතිය වෙත එවනු ලබන ප්‍රතිපාදන ඔවුන් රඳවාගෙන වියදම් කරනු ලබන අතර අමාත්‍යාංශ ව්‍යාපෘති | - එම - |

| | | |
|---|---|---|
| (iii) වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මඟින් උක්ත ව්‍යාපෘතියේ කටයුතු සඳහා වෙන් කර තිබූ ප්‍රතිපාදන සීමාව ඉක්මවා 2020 වර්ෂයේ රු.මි 470ක් හා 2021 වර්ෂයේ රු.මි.103ක් වැය කර තිබුණි. | ඒකකය ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති කාර්යයන් සඳහා අදාළ වන මුදල් පමණක් භාණ්ඩාගාරය වෙත ලබා දෙනු ලබයි.<br>• කෙසේ වෙතත් අමාත්‍යාංශ ලේකම් විසින් භාණ්ඩාගාර විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ (ERD) අධ්‍යක්ෂක ජනරාල්ගේ 31/01/2022 ලිපිය ප්‍රකාරව මෙම ව්‍යාපෘතිය වෙත මුදල් නිසිලෙස ලබා දීමටත් UNDP ආයතනය විසින් වැයකරන ලද මුදල් පිළිබඳව සියලු තොරතුරු මහා භාණ්ඩාගරය වෙත ලබා දීමට සලස්වන ලෙසත් දන්වා තිබිණි. ඒ අනුව මුදල් ලබා දීම සිදුකරන අතර UNDP ආයතනය විසින් පසුගිය වසර වල කරනු ලැබූ වියදම් වාර්ථා කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් සිටී. | ව්‍යාපෘතියේ සමස්ත වියදම ආවරණය වන පරිදි වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මඟින් ප්‍රතිපාදන වෙන් කරගත යුතු අතර ප්‍රතිපාදන සීමාව ඉක්මවා වියදම් නොකළ යුතුයි. |
| (iv) හරිත දේශගුණ අරමුදල සමඟ ශ්‍රී ලංකා රජය අත්සන් තබන ලද ආධාර ගිවිසුම අනුව ශ්‍රී ලංකා රජයේ දායකත්වය සියයට 15කි. මෙම ව්‍යාපෘතිය යටතේ මහා භාණ්ඩාගාරය වෙත 2017 සිට 2022 දක්වා කාලසීමාව තුළ රු.මිලියන 1,465 ක් ලැබී තිබුණු අතර ශ්‍රී ලංකා රජයේ දායකත්වය ලෙස රු.මිලියන 1,423 ක් වැය කර තිබුණි. ඒ අනුව ව්‍යාපෘතිය මඟින් ප්‍රතිපූර්ණය කරන ලද මුදලට ආසන්න මුදලක් රජය විසින්ද වැය කර තිබුණි. | | ආධාර ගිවිසුම ප්‍රකාරව ශ්‍රී ලංකා රජයේ දායකත්වය දැරිය යුතුය. |
| (ඉ) විදේශ ණය අපේක්ෂාවෙන් EPC කොන්ත්‍රාත් ගිවිසුම් යටතේ ඇමරිකානු ඩොලර් මඟින් ගෙවීම් කිරීමේ කොන්දේසි ඇතුළත් කර ගිං නිල්වලා හැරවීමේ ව්‍යාපෘතිය, උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය සහ භූගත ජල විමංසන තොරතුරු ජාලයක් ස්ථාපිත කිරීම යන ව්‍යාපෘතීන් ආරම්භ කර තිබුණ ද ඒ සඳහා විවිධ හේතූන් මත අපේක්ෂිත පරිදි විදේශ අරමුදල් ලැබී නොතිබුණු නමුත් ඒවා දේශීය අරමුදල් යොදවා ක්‍රියාත්මක කර තිබුණි. විදේශ අරමුදල් නොලැබුණද කොන්ත්‍රාත් සඳහා ඇමරිකානු ඩොලර් මඟින් ගෙවීම් කිරීමට සිදුවීමෙන් රටෙහි විදේශ සංචිත වලට ඇති වන බලපෑම පිළිබඳ ප්‍රමාණවත් තක්සේරුවක් කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත. | ශ්‍රී ලංකාව තුළ කොන්ත්‍රාත් වලට ගෙවිය යුත්තේ රුපියල් වලින් බැවින් ඩොලර් වලින් ගෙවීමට එකඟව ගිවිසුම් ගත වීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව ක්‍රියාමාර්ග ගත යුතුය. විදේශ අරමුදල් නොලැබීම හා ඩොලර්වලින් ගෙවීමට සිදුවීම පිළිබඳ අමාත්‍ය මණ්ඩලය දැනුවත් කර රුපියල් වලින් ගෙවීමට හැකිවන සේ ගිවිසුම් සංශෝධනය කළ යුතුය. |

## 3.7 දේශීය අරමුදල්වලින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **ඵලදායීතා ප්‍රවර්ධන හා වාරිමාර්ග පද්ධති කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය** | | |
| (i) | මෙම ව්‍යාපෘතිය 2017 - 2021 කාලපරිච්ඡේදය තුළ රු.මිලියන 18,500 ක පිරිවැයක් යටතේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කර තිබුණු අතර ඒ සඳහා සංවර්ධන පාර්ශවකරුවන් වෙතින් ලබා ගැනීමේ හැකියාව පිළිබඳ පරීක්ෂා කර බලන ලෙස අමාත්‍ය මණ්ඩලය විසින් උපදෙස් ලබා දී තිබුණද ඒ සඳහා පියවර ගෙන නොතිබුණි. | අංක 17/0190-729/003 දරන "ඵලදායිතාව ඉහළ නැංවීමේ හා වාරිමාර්ග පද්ධතියේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය" යන මැයෙන් වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ ඇමතිතුමා ඉදිරිපත් කළ 2017.01.23 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාළ 2017.02.22 දිනැති තීරණයේ (iii) මඟින්, මෙම ව්‍යාපෘතිය සඳහා සංවර්ධන පාර්ශ්වකරුවන් වෙතින් අරමුදල් ලබා ගැනීමේ හැකියාව පිළිබඳ පරීක්ෂා කර බලන ලෙස , විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නියම කරන ලෙස ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ට උපදෙස් ලබා දී ඇත. | අමාත්‍ය මණ්ඩලය විසින් ලබා දී ඇති උපදෙස් අනුව ආධාර ලබාගත හැකි දේශීය හා විදේශීය ආයතන වලින් අරමුදල් ලබා ගැනීමට කටයුතු නොකර භාණ්ඩාගාර ප්‍රතිපාදන ලබා ගෙන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කළ යුතුය. |
| (ii) | මේ සඳහා 2017 සිට 2022 දක්වා රු. මිලියන 2,978.85ක් වෙන්කර තිබූ නමුත් ඉන් රු. මිලියන 1,730.99ක් පමණක් වැයකර තිබූ අතර අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව අනුව ව්‍යාපෘතියේ භෞතික කාර්යසාධනය සියයට 10ක් විය. එසේ තිබියදී 2023 වර්ෂයේ සිට ඉදිරියට ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකිරීමට තීරණය කර තිබුණි. දරන ලද පිරිවැයෙන් වැඩි කොටසක් ව්‍යාපෘතිය සඳහා බඳවා ගත් නිලධාරීන්ගේ වැටුප්, දීමනා සඳහාද, ව්‍යාපෘති කාර්යාලය පවත්වාගෙනයාම හා එහි නඩත්තු කටයුතු සඳහාද, ඉන්ධන ගමන් වියදම් ඇතුළු පරිපාලන වියදම් සඳහා ද දරා තිබුණු අතර ඒ හේතුවෙන් භෞතික කාර්ය සාධනය අවම වී තිබුණි. | හැකි සෑම අවස්ථාවකදීම ලැබී ඇති ප්‍රතිපාදන අනුව කාර්යය මණ්ඩලය සීමා කිරීමට කටයුතු කර ඇති අතර 2018,2019 **හා** 2020 වර්ෂවල බඳවාගනු ලැබූ කාර්යය මණ්ඩලය ද අනුමත කාර්යය මණ්ඩලයේ ප්‍රතිශතයක් ලෙස ගත් කළ පිළිවෙළින් සියයට 59 **ක් හා** සියයට 65 **ක්** වේ. 2021 වර්ෂයේ සිට කාර්යය මණ්ඩලය 06 දෙනෙකුට සීමා කර ඇති අතර අත්‍යාවශ්‍ය කටයුතු සඳහා පමණක් මෙම නිලධාරීන් යොදවාගෙන ඇත. | ව්‍යාපෘති අරමුණු ඉටුකර ගැනීම සඳහා ප්‍රමුඛතාවය ලබා දී, අවම ව්‍යාපෘති කාර්ය මණ්ඩලයක් මඟින් කටයුතු කර ගැනීමට හා පරිපාලන වියදම් අවම කර ගැනීමට හැකිවන පරිදි සැලසුම් සකස් කර ඒ අනුව ක්‍රියාත්මක විය යුතුය. සේවකයන්ගේ වාර්ෂික සේවා දිගු ලබා දීමේ දී ව්‍යාපෘති කාර්යසාධනය සලකා බැලිය යුතුය. |

(ආ) **ගම සමඟ පිළිසඳරක් වැඩසටහන**

උක්ත වැඩසටහන දිස්ත්‍රික්ක 5ක ක්‍රියාත්මක කිරීමට 2021 වර්ෂයේ ව්‍යාපෘති 6ක් සඳහා රු.මි 1,616ක මුදලක්ද 2022 වර්ෂයේ රු. මිලියන 610.14ක් ද වෙන් කර තිබුණි.

| | | | |
|---|---|---|---|
| (i) | වැය විෂයය අංක 198-02-03-52-2506(11) වාරි සෞභාග්‍යා වැඩසටහන යටතේ 2022 වර්ෂය සඳහා රු. මිලියන 610.14 ක ප්‍රතිපාදන වෙන්කර තිබූ අතර එම ප්‍රතිපාදන වලින් රු.මිලියන 208.53 ක් මු.රෙ 20(1) විධිවිධානයන්ට අනුකූලව වාර්ෂික ඇස්තමේන්තු තුළ ප්‍රතිපාදන වෙන් කර ගෙන නොතිබුණු ගම සමඟ පිළිසඳරක් වැඩ සටහන සඳහා වැය කර තිබුණි. | පිළිතුරු ලබා දී නැත. | මු.රෙ 20(1) විධිවිධානයන්ට අනුකූලව වාර්ෂික ඇස්තමේන්තු තුළ ප්‍රතිපාදන වෙන් කර ගැනීමකින් තොරව නව ව්‍යාපෘති ක්‍රියාත්මක නොකළ යුතුය. |
| (ii) | අනුරාධපුර දිස්ත්‍රික්කයේ, කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පදවිය හා වාහල්කඩ ගොවි ව්‍යාපාර වල ඇළ පද්ධතිය වැඩි දියුණු කිරීම සඳහා රු.මිලියන 116 ක ඇස්තමේන්තු 2 ක් අනුමත කර තිබුණි. එම ඇස්තමේන්තුවට අදාළ වැඩ කොටස් ඉටුකර ගැනීමට අවශ්‍ය ඇස්තමේන්තුගත බොරළු ප්‍රමාණය භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙතින් බලපත්‍ර ලබාගෙන කැණීම්කර ගැනීමට කටයුතු නොකර පෞද්ගලික සැපයුම්කරුවන් ගෙන් මිලදී ගෙන සංවර්ධන කටයුතු සිදු කර තිබුණි. | පිළිතුරු ලබා දී නැත. | වාරිමාර්ග ක්ෂේත්‍රයේ නඩත්තු හා සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය පස් හා බොරළු රජයේ ඉඩම්වලින් ලබා ගැනීම සඳහා අදාළ රේඛීය අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණයෙන් නිසි වැඩ පිළිවෙලක් සකස් කර ගත යුතුය. |
| (iii) | වගාබිම් සඳහා ජල සැපයුම් ඉදිකිරීමට සැලසුම් කර තිබූ අතර ඒ සඳහා අවශ්‍ය හියුම් පයිප්ප 2411ක් මිලදී ගෙන ඉන් 1017ක් ගොවි සංවිධාන වෙත නිකුත් කර තිබුණද එමඟින් අපේක්ෂිත පරිදි ජල සැපයුම් ඉදිකර නොතිබුණි. හියුම් පයිප්ප 1394ක් පදවිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයේ ගොඩ ගසා තිබුණි. | පිළිතුරු ලබා දී නැත. | මිලදී ගත් පයිප්ප භාවිතා කර අපේක්ෂිත ජල සැපයුම් කඩිනමින් ඉදි කර වාර්තා කළ යුතුය. ව්‍යාපෘති කාර්යයන් නිසි සැලසුමකින් යුතුව ඉටු කළ යුතු අතර ප්‍රතිපාදන මනාව කළමනාකරණය කරගත යුතුය. |

| | | |
|---|---|---|
| (iv) මු.රෙ.20(1) විධානයන්ට අනුකූලව ප්‍රතිපාදන වෙන් කර ගැනීමකින් තොරව ආරම්භ කර තිබූ උක්ත (ආ)(ii) හා (iii) ව්‍යාපෘති සඳහා 2023 වර්ෂය සඳහා ප්‍රතිපාදන නොලැබීම මත අතරමඟ නවතා තිබීම හේතුවෙන් දරන ලද පිරිවැය නිෂ්කාර්ය වී තිබුණි. | පිළිතුරු ලබා දී නැත. | ප්‍රමුඛතා පදනමක් මත ව්‍යාපෘති කාර්යයන් සම්පූර්ණ කිරීම සඳහා ප්‍රතිපාදන ලබාගැනීමට පියවර ගත යුතුය. |

## 3.8 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාරිමාර්ග අමාත්‍යාංශය නමින් ලියාපදිංචි වී ඇති වාහන පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතිය තුළින් ලබාගත් තොරතුරු අනුව වාරිමාර්ග අමාත්‍යාංශය, වාරිමාර්ග ලේකම්, හෝ අමාත්‍යාංශ ලිපිනය යටතේ වාහන 650ක් ලියාපදිංචි වී තිබුණි. වාරිමාර්ග අමාත්‍යාංශයේ වාහන ලේඛනය අනුව අමාත්‍යාංශයට අයත් හා පරිහරණය කරනු ලබන වාහන සංඛ්‍යාව 306 ක් විය. ඒ අනුව වාහන 347ක් අමාත්‍යාංශය භාරයේ නොපැවතුණි. | වාහන 650 පමණ ප්‍රමාණයක් මෙම අමාත්‍යාංශය නමින් ලියාපදිංචි වී ඇතත් පරිසර අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය වෙන් වන අවස්ථාවේ එම වාහන වලින් කොටසක් එම අමාත්‍යාංශ වලට ලබා දී ඇත. මීට අමතරව වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය හා වාරිමාර්ග කළමනාකරණ අංශය යන ආයතන වලට ද වාහන වලින් කොටසක් ලබා දී ඇත.<br><br>මොරගහකන්ද කළු ගඟ සංවර්ධන ව්‍යාපෘතිය වෙත මෙම අමාත්‍යාංශය වෙතින් ගෙනා වාහන 72 ක් ද මෙම අමාත්‍යාංශය නමින් ලියාපදිංචි කර ඇතත් එම වාහන එම ව්‍යාපෘතිය මඟින් භාවිතා කරනු ලබයි. උමා ඔය ව්‍යාපෘතිය, CResMPA ව්‍යාපෘතිය මඟින් භාවිතා කරනු ලබන වාහන අදාළ ආයතන වෙත විධිමත් පරිදි භාර දීමේ කටයුතු මේ වන විට සිදුවෙමින් පවතී. | අමාත්‍යාංශය භාරයේ නොපවතින වාහන එකින් එක හඳුනා ගැනීමට හා වෙනත් ආයතන වලට ලබා දී ඇති වාහන නෛතිකව පවරා දීමට කටයුතු කළ යුතුය. වාහන පිළිබඳ දත්ත පද්ධතියක් පවත්වාගත යුතුය. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1) වගන්තිය යටතේ සිදු කරනු ලබන සමාලෝචනයේදී වාහන පාලනය සඳහා නව පාලන පද්ධති හඳුන්වා දීමට කටයුතු කළ යුතුය. |

## 3.9 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් පාඩු හා අත්හැරීම් ප්‍රකාශනයේ තව දුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති වාහන අනතුරු 4කට අදාළව එකතුව රු.12,189,753 | මොරගහකන්ද - කළුගඟ සංවර්ධන ව්‍යාපෘතියට අයත් WP PG 0456 දරන ටොයොටා ඩබල් කැබ් රථය 2021.10.22 දින | වගකිව යුතු පාර්ශව ලෙස හඳුනා ගෙන ඇති නිලධාරීන් වෙත රජයෙන් |

| | | |
|---|---|---|
| ක් වූ අතර, ඉන් වාහන අනතුරු 2කට අදාළව සිදුව තිබූ අලාභය රු. 11,716,700ක් 2022 දෙසැම්බර් 31 දිනට රක්ෂණ ආයතන වලින් ලබා ගැනීමට නොහැකි වී තිබුණි. උක්ත වාහන වල අලාභය නිර්දේශ පරිදි අදාළ රියදුරන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අනතුරට පත්වීමට අදාළව මු.රෙ. 104 (4) අනුව වරදකරු වී ඇති එම්. ඩබ්. විජිත බණ්ඩාර විජේතුංග මයාගෙන් රු. 10,428,500ක් වන අලාභ මුදල අයකර ගැනිම සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් ඔහු වෙත සිහිකැදවීම් ලිපි යවා ඇති නමුත් ඒ සඳහා මෙතෙක් කිසිදු ප්‍රතිචාරයක් දක්වා නොමැත. අදාළ ලිපි ගොනුව නීති නිලධාරී වෙත යොමු කර නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇත.<br>අංක PB- 4434 දරන කැබ් රථය 2019.02.28 දින අනතුරට ලක්වීමට අදාළව පරීක්ෂණ මණ්ඩල වාර්තාවට අනුව රථයේ රියදුරු වන ඩබ්.ඒ.එම්.ඩී.ඩබ්.බණ්ඩාර යන අය සම්පූර්ණ වගකිව යුතු බව තීරණය කර ඇත. ඒ අනුව අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගන්නා ලෙස දන්වමින් අමාත්‍යාංශ නීති නිලධාරී වෙත ලිපියක් යොමු කර ඇත. | කරනුලබන ගෙවීම් වලින් හැකි උපරිම ප්‍රමාණය අයකරගත යුතුය.<br>ඉතිරි මුදල් අය කර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.10 අනාර්ථික ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ------------------------------------- | ---------------- |
| (අ) | මොරගහකන්ද ජලාශයේ ප්‍රධාන බැම්ම ඉදිකිරීම ව්‍යාපෘතියේ විදුලි උත්පාදන යන්ත්‍ර හතරක් සවිකිරීම වෙනුවෙන් ඇමෙරිකානු ඩොලර් 10,937,960ක් වැඩිපුර ගෙවීම.<br>මොරගහකන්ද ජලාශයේ ප්‍රධාන බැම්ම ඉදිකිරීම මූලික ගිවිසුමේ විෂය පථය අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් තොරව 2013 පෙබරවාරි මස වෙනස් කර තිබූ අතර ඒ සඳහා 2016 නොවැම්බර් 23 දින ඉදිරිපත් කර තිබූ අංක 16/2513/704/067 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය මගින්, ව්‍යාපෘතියේ මුල් විෂය පථය වෙනස් වීම හේතුවෙන් EPC/Turnkey කොන්ත්‍රාත්කරු වෙත ඇමෙරිකානු ඩොලර් 10,937,960 ක් ගෙවීමට නිර්දේශ කර ඒ සඳහා අනුමැතිය ඉල්ලා තිබුණි. අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව, ව්‍යාපෘතියේ මූලික සැලැස්ම මගින් ඉදිකිරීමට | මොරගහකන්ද ජලාශ ව්‍යාපෘතියේ මූලික සැලසුම් සිදු කරනු ලැබුවේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මඟිනි. 2007 වසරේ ආරම්භ කළ ව්‍යාපෘතිය 2013 වසරේදී ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් (PMU) පිහිටුවමින් අමාත්‍යාංශය යටතට ලබාගෙන ඇත. මෙම ව්‍යාපෘතියෙහි මූලික අරමුණ වී ඇත්තේ කෘෂිකර්මාන්තයට අදාළ ජලය අවශ්‍ය ප්‍රදේශ වලට ලබා දීමට වූ අතර එහිදී නිකුත් කරන ජලය ජල විදුලිය නිපදවීමට භාවිතා කළ හැකි බැවින් ඒ සඳහා විදුලි ජනන යන්ත්‍ර ඇතුළත් කරමින් සැලසුම් සකස් කර ඇත.<br><br>අමප/16/2513/704/067 හා 2016 දෙසැම්බර් 07 දින අනුමත කර ගෙන ඇති අමාත්‍ය මණ්ඩල | මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ව්‍යාපෘතියේ දුර්වල සැලසුම් කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමට අදාළ පත්කිරීම් බලධාරීන් වෙත වාර්තා කළ යුතුයි.<br>2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1) වගන්තියේ විධිවිධාන |

යෝජිතව තිබූ මෙගාවොට් 5 විදුලි ජනන යන්ත්‍ර 2 ක් හා මෙගාවොට් 15 විදුලි ජනන යන්ත්‍ර 1 ක් වශයෙන් විදුලි ජනන යන්ත්‍ර 3 ක් මගින් මෙගාවොට් 25 ක් උත්පාදනය කරන විදුලි බලාගාරය වෙනුවට මෙගාවොට් 5 ක විදුලි ජනන යන්ත්‍ර 2 ක් හා මෙගාවොට් 7.5 ක විදුලි ජනන යන්ත්‍ර 2 ක් වශයෙන් විදුලි ජනන යන්ත්‍ර 4 ක් මගින් මෙගාවොට් 25 ක් උත්පාදනය කරන විදුලි බලාගාරයක් ඉදි කිරීමට තීරණය කර තිබුණි. 2016 නොවැම්බර් 29 දිනැති අංක අමප/16/2513/704/067 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ඒ සඳහා අනුමැතිය ලබා දීමේදී "මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණයන්හි අවධාරණය කරනු ලැබූ කරුණු සැලකිල්ලට ගෙන ඒ අනුව ක්‍රියාකරන" ලෙස මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නියම කර තිබුණි. එහිදී "මෙගා වොට් 10 ඉක්මවූ විදුලි බලාගාර ක්‍රියාත්මක කිරීමේ බලය ලංකා විදුලිබල මණ්ඩලය පමණක් සතුවන නිසා මෙගාවොට් 15ක විදුලි ජනන යන්ත්‍රය මෙහෙයවීමට මහවැලි සංවර්ධන අමාත්‍යාංශයට බලය නොමැති බව පසුව අනාවරණය වීම ව්‍යාපෘතියේ විෂය පථය වෙනස් කිරීමට හා කොන්ත්‍රාත් විචලනයට හේතු වී ඇති බවත්, ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීමට ප්‍රථම ලංකා විදුලිබල මණ්ඩලයෙන් මේ සම්බන්ධයෙන් අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම රේඛීය අමාත්‍යාංශයේ වගකීමක් වන බවත්, ව්‍යාපෘතියේ විෂය පථය තීරණය කිරීමට ප්‍රථම මෙම ව්‍යාපෘති සැලැස්මේ පාර්ශවකරුවෙකු වූ ලංකා විදුලිබල මණ්ඩලයෙන් උපදෙස් ලබා නොගැනීම සඳහා රේඛීය අමාත්‍යාංශයේ නිලධාරීන් වගකිව යුතු බවත්" මුදල් අමාත්‍යවරයා නිරීක්ෂණය කර තිබුණි.

කෙසේ වුවද මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණය ක්‍රියාත්මක කිරීමෙන් තොරව අතිරේක ගෙවීම පමණක් සිදු කර තිබූ අතර අතිරේකව දැරීමට සිදු වූ ඇමෙරිකානු ඩොලර් මිලියන 10.94 ක වියදම රජයට සිදු වූ පාඩුවක් විය.

ඒ අනුව අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි සංදේශයට අනුව මෙය කුඩා ජල විදුලි උත්පාදන බලාගාරයක් (Mini Hydro Station) ලෙස පවත්වාගෙන යාම සඳහා තීරණය කර ඇත. නමුත් මෙගා වොට් 10ට වැඩි යන්ත්‍ර අයිතිය ශ්‍රී ලංකා විදුලි බල මණ්ඩලය සතු වන බැවින් එම මෙගා වොට් 15ක යන්ත්‍රය මෙගා වොට් 7.5ක යන්ත්‍ර දෙකක් දක්වා වෙනස් කර ඇත. මෙම වෙනස් කිරීම නිසා විදුලි බලාගාරයේ සිදු වූ වෙනස්කම් මත මෙම මුදල කොන්ත්‍රාත්කරු වෙත ගෙවීමට සිදු වී ඇත.

ව්‍යාපෘතියේ සැලසුම්කරණය වරින් වර ස්ථාන කිහිපයකින් එනම් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය මගින් සිදු වී ඇති බැවින් එයට අදාළ සියලු තොරතුරු එක් ස්ථානයකින් ලබා ගැනීමේ අපහසුතාව පවතී. ප්‍රකාරව නීතිය බලාත්මක කිරීමේ නියෝජිත ආයතන වෙත පැමිණිලි කළ යුතු අතර සිදුකර ඇති අලාභ අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

ව්‍යාපෘතියක් සැලසුම් අදියරේ සිට අවසාන අදියර දක්වා වූ විවිධ මෙහෙයුම් කටයුතු සඳහා සම්බන්ධවන සියලු අංශ සමඟ මනා සම්බන්ධීකරණයක් සහිතව එක් එක් අදියර ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය.

| | | |
|---|---|---|
| ව්‍යාපෘතියේ දුර්වල සැලසුම් කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමට අදාළ පත්කිරීම් බලධාරීන් වෙත වාර්තාකළ යුතුව පැවති නමුත් ඒ සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | | |
| (ආ) උක්ත අමාත්‍ය මණ්ඩල සංදේශයේ 2.2 ඡේදය අනුව ව්‍යාපෘතිය අවසන් කිරීමෙන් පසුව ප්‍රධාන බැම්ම හා එහි විදුලිබල පද්ධතිය වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ පාලනය කර, ශ්‍රී ලංකා රජය වෙනුවෙන් විදුලි බලය නිපදවිය යුතු අතර, නිෂ්පාදිත විදුලිය ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලයට අලෙවිකර ලබා ගන්නා මුදලින් ව්‍යාපෘතිය සඳහා ලබාගත් ණය මුදල ආපසු ගෙවිය යුතුවේ. මොරගහකන්ද, කළුගඟ ව්‍යාපෘතියේ 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය සඳහා දරා තිබූ පිරිවැය රු. 107,941,306,934 ක් විය. ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලයේ විදුලි ජනන වාර්තා අනුව ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද මෙගාවොට් 25ක විදුලි බලාගාරය මඟින් වාර්ෂික සාමාන්‍ය විදුලි උත්පාදනය මෙගාවොට් 67,549,773ක් හා ලංකා විදුලිබල මණ්ඩල ගාස්තු අනුව එහි වටිනාකම රු.1,188,898,473ක් විය. ඒ අනුව විදුලි උත්පාදනයේ සමස්ත ආදායම මඟින් ව්‍යාපෘතියේ ප්‍රාග්ධන පිරිවැය ආවරණය කිරීම සඳහා ගතවන කාලය අවුරුදු 90.9ක් විය. | පිළිතුරු ලබා දී නැත. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පෙර පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයන් සිදු කළ යුතු අතර මෙම ව්‍යාපෘති යටතේ ඉදිකළ විදුලි බලාගාරය සඳහා දරන ලද පිරිවැය සාධාරණ කාලයක් තුළ පියවාගැනීමට ඇති හැකියාව සම්බන්ධයෙන් සොයාබැලිය යුතුය. |

### 3.11 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ------------------------ | ---------------------------------- | --------------- |
| වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් අනුගමනය කරන ගෙවීම් පටිපාටිය, මු.රෙ. 135 ප්‍රකාර මූල්‍ය පාලනය සම්බන්ධව කාර්යයන් පැවරීමට අනුකූල නොවන බැවින් එම පටිපාටිය නිවැරදි කරන ලෙස 2011 මාර්තු 22 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී | මෙම ගෙවීම් පටිපාටිය නිවැරදි කිරීම සම්බන්ධයෙන් අදාළ පාර්ශවයන් සමඟ සාකච්ඡා කිරීම් සිදු කරමින් පවතින අතර අවසන් වරට එම සාකච්ඡා පවත්වන ලද්දේ 2023.03.15 දිනදී ය. | රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් අමාත්‍යාංශ ලේකම් වෙත ලබා දී ඇති නියෝග වසර 12ක් තුළ ක්‍රියාත්මක |

| | | |
|---|---|---|
| අමාත්‍යාංශ ලේකම්ට නියෝග කර වසර 12 ක් ගත වී තිබුණද 2023 අප්‍රේල් 30 වන විටත් නියෝගය ක්‍රියාත්මක කර නොතිබුණි. | | නොකිරීමට හේතු, වාරිමාර්ග දෙපාර්තමේන්තුව තුළ එම කාලසීමාව තුළ සිදු වී ඇති අවභාවිතයන් පිළිබඳ තක්සේරුවක්ද සමඟ රාජ්‍ය ගිණුම් කාරක සභාව වෙත වාර්තා කළ යුතුය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලය 428ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 246ක් විය. ඒ අනුව, ජ්‍යෝෂ්ඨ මට්ටමේ තනතුරු 51ක්, තෘතීක මට්ටමේ තනතුරු 14ක්, ද්විතීක මට්ටමේ තනතුරු 55ක් සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 62ක් වශයෙන් පුරප්පාඩු 182ක් වූ අතර ද්විතීක මට්ටමේ තනතුරක, ප්‍රාථමික මට්ටමේ තනතුරු 3ක, සංවර්ධන නිලධාරී තනතුරු 352ක අතිරික්ත කාර්ය මණ්ඩලයක් විය. | අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත දන්වා ඇත.<br>352ක් වූ අතිරික්ත කාර්ය මණ්ඩලය (සංවර්ධන නිලධාරී) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් 2023 වර්ෂය සඳහා අනුමත කර ගන්නා ලදී. | කාර්ය මණ්ඩල අවශ්‍යතාවය පිළිබඳ කාලීනව සමාලෝචනයට ලක් කළ යුතුය. |